# මුදල් ප්‍රතිපත්ති වාර්තාව

## 2026 අගෝස්තු

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

*මුදල් ප්‍රතිපත්ති වාර්තාව වසරකට දෙවරක් පළ කෙරෙනු ලබන ප්‍රකාශනයකි. මෙම වාර්තාවේ අන්තර්ගතය, 2026 වසරේ ජූලි මස 22 වන දින සිදු කළ මුදල් ප්‍රතිපත්ති නිවේදනය සමඟ නිමාවට පත් වුණු ශ්‍රී ලංකා මහ බැංකුවේ 2026 වසරේ ජූලි මාසයේ මුදල් ප්‍රතිපත්ති තීරණ වාරය වනවිට පැවති දත්ත මත මූලික වශයෙන් පදනම් වේ.*

© ශ්‍රී ලංකා මහ බැංකුව

ISBN 978-624-6764-39-5

2026 අගෝස්තු 13

# පටුන


**ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති රාමුව ........ 4**

**සාරාංශය ........ 6**

**1. මුදල් ප්‍රතිපත්ති සාරාංශය ........ 8**

**2. උද්ධමනයේ සහ ආර්ථිකයේ ඉදිරි දැක්ම ........ 10**

**2.1. මූලික පුරෝකථන ........ 10**

උද්ධමනය පිළිබඳ ඉදිරි දැක්ම ........ 11

උද්ධමන අපේක්ෂා ........ 15

මූර්ත ආර්ථික වර්ධනය පිළිබඳ ඉදිරි දැක්ම ........ 16

**2.2. පුරෝකථන සඳහා පාදක වන ප්‍රධාන උපකල්පන ........ 17**

ගෝලීය පරිසරය ........ 17

රාජ්‍ය මූල්‍ය අංශයේ ගමන් මග ........ 19

විදේශීය ජංගම ගිණුම ........ 19

**2.3 වාර්තා වන සැබෑ දත්ත මූලික පුරෝකථනවලින් අපගමනය වීමට ඇති අවදානම් ........ 19**

වාර්තා වන සැබෑ උද්ධමනය මූලික පුරෝකථනවලින් අපගමනය වීමට ඇති අවදානම් ........ 19

වාර්තා වන සැබෑ ආර්ථික වර්ධනය මූලික පුරෝකථනවලින් අපගමනය වීමට ඇති අවදානම් ........ 20

**2.4. පෙර පුරෝකථන සමඟ සැසඳීම ........ 21**

මැදි කාලීන පුරෝකථන සඳහා භාවිත කළ ප්‍රධාන උපකල්පන ........ 21

උද්ධමනයේ හැසිරීම ........ 22

**3. වර්තමාන ආර්ථික තත්ත්වය ........ 23**

**3.1. උද්ධමනය ........ 23**

**3.2. මූර්ත අංශය ........ 29**

**3.3. මුදල් අංශය ........ 31**

පොලී අනුපාතික ........ 31

දේශීය මුදල් වෙළඳපොළ ද්‍රවශීලතාවය ........ 34

දේශීය ණය තත්ත්ව සහ මුදල් සැපයුම ........ 35

**3.4. විදේශීය අංශය ........ 38**

ගෙවුම් තුලනය ........ 38

විනිමය අනුපාතිකය ........ 42

සංචිත වත්කම් ........ 43

**3.5. රාජ්‍ය මූල්‍ය අංශය ........ 44**

**3.6. මූල්‍ය අංශය ........ 45**

**3.7. ගෝලීය ප්‍රවණතා ........ 48**

# ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති රාමුව

2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතට අනුව, දේශීය මිල ස්ථායීතාව ළඟා කර ගැනීම හා පවත්වාගෙන යාම ශ්‍රී ලංකා මහ බැංකුවේ මූලික අරමුණයි. උද්ධමනය අඩු සහ ස්ථායි මට්ටමක පවත්වාගෙන යෑමෙන්, මහ බැංකුව දිගු කාලීන ආර්ථික වෘද්ධිය ප්‍රවර්ධනය කිරීමට සහාය වන අතර එමගින් මහජනතාවගේ යහපැවැත්ම වෙනුවෙන් දායක වෙයි.

මහ බැංකුව දේශීය මිල ස්ථායීතාව සාක්ෂාත් කර ගැනීම සහ පවත්වා ගැනීම සඳහා මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරයි. මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය[1] මුදල් ප්‍රතිපත්ති සකස් කිරීමේ හා නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුව සමඟ සමගාමී වන නම්‍යශීලී විනිමය අනුපාතික ක්‍රමය ක්‍රියාත්මක කිරීමේ වගකීම දරයි. මුදල් අමාත්‍යවරයා සහ මහ බැංකුව අතර ඇති කරගත් මුදල් ප්‍රතිපත්ති රාමු ගිවිසුම මගින් තීරණය කර ඇති ඉලක්කගත මට්ටමේ උද්ධමනය පවත්වාගෙන යෑම මෙම නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුවේ අරමුණයි. මෙම ගිවිසුම මුදල් ප්‍රතිපත්ති රාමු ගිවිසුම ලෙස හැඳින්වේ. 2023 වසරේ ඔක්තෝබර් මාසයේ දී රජයේ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කරන ලද වත්මන් මුදල් ප්‍රතිපත්ති රාමු ගිවිසුමට අනුව, ශ්‍රී ලංකා මහ බැංකුව කාර්තුමය මතුපිට උද්ධමනය 5%ක අගයක පවත්වාගත යුතුය.[2] මුදල් ප්‍රතිපත්ති ගිවිසුම් රාමුව යටතේ, උද්ධමනයේ ඇතිවිය හැකි අපගමනයන් මැනීමට හා මහ බැංකුවේ වගවීමේ අරමුණු සඳහා ප්‍රතිශතාංක ±2ක ආන්තිකයක් (එනම් 3.0 %– 7.0%) ලබා දී ඇත. අනුක්‍රමික කාර්තු දෙකක් සඳහා උද්ධමනය එම ආන්තික දෙක අතර පවත්වා නොගතහොත්, මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය විසින් මුදල් අමාත්‍යවරයා හරහා පාර්ලිමේන්තුව වෙත වාර්තාවක් ඉදිරිපත් කළ යුතු අතර, එය මහජනතාවට ද ලබා ගත හැකි විය යුතුය. ගිවිසුමෙහි දක්වා ඇති උද්ධමන ඉලක්කය සහ අනෙකුත් අදාළ පරාමිතීන් සෑම වසර තුනකට වරක් සමාලෝචනයට භාජනය වේ.

උද්ධමන ඉලක්කය ළඟා කරගැනීම සඳහා, මහ බැංකුව කෙටි කාලීන වෙළඳපොළ පොලී අනුපාතික ඉලක්කගත මග ඔස්සේ මෙහෙයවීමට සිය මුදල් ප්‍රතිපත්ති උපකරණ භාවිත කරයි. වත්මන් මුදල් ප්‍රතිපත්ති රාමුව යටතේ, එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය මහ බැංකුවේ ප්‍රධාන ප්‍රතිපත්ති උපකරණය ලෙස පවතින අතර, එය මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය සන්නිවේදනය හා ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගැනේ. බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය මෙම මුදල් ප්‍රතිපත්ති රාමුවේ මෙහෙයුම් ඉලක්කය ලෙස ක්‍රියාත්මක වෙයි. ඒ අනුව, එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය ප්‍රකාශයට පත් කළ පසු, බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය මත හෝ ඒ ආසන්නව පවත්වාගෙන යෑමට මහ බැංකුව සිය මුදල් ප්‍රතිපත්ති මෙහෙයුම් ක්‍රියාවට නංවයි. එලෙස මුදල් ප්‍රතිපත්ති මෙහෙයුම් ක්‍රියාත්මක කිරීමේ දී පවතින සහ අපේක්ෂිත දේශීය වෙළඳපොළ ද්‍රවශීලතා තත්ත්වයන් පිළිබඳව මනාව සැලකිල්ලට ගනු ලබයි. මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයට අදාළව තීරණ ගැනීමෙන් අනතුරුව, එම ස්ථාවරයට අනුකූලව, එක්දින වෙළඳපොළ පොලී අනුපාතිකවල සිදුවන වෙනස්කම් මූල්‍ය වෙළඳපොළ හරහා සමස්ත ආර්ථිකයට සම්ප්‍රේෂණය වන අතර, අවසානයේ එය උද්ධමනය කෙරෙහි බලපෑම් ඇති කරයි.

[1] මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය මහ බැංකු අධිපතිවරයා, මහ බැංකුවේ පාලක මණ්ඩලයේ සාමාජිකයන්, ආර්ථික විද්‍යාව හා මූල්‍ය යන ක්ෂේත්‍රවල විශේෂඥයන් දෙදෙනෙක් මෙන් ම මිල ස්ථායීතාව සහ මූල්‍ය පද්ධති ස්ථායීතාව භාර මහ බැංකුවේ නියෝජ්‍ය අධිපතිවරුන්ගෙන් සමන්විත වේ.

[2] අංක 2352/20 දරන අති විශෙෂ ගැසට් පත්‍රය මගින් උද්ධමන ඉලක්කය මහජනතාවට සන්නිවේදනය කරන ලදී. කාර්තුමය මතුපිට උද්ධමනය යනු අනුරූප කාර්තුවේ මාස තුන තුළ මාසිකව කොළඹ පාරිභෝගික මිල දර්ශකයේ (කො.පා.මි.ද) වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස්වීමේ සරල සාමාන්‍යයයි.

මුදල් ප්‍රතිපත්ති තීරණ ඉදිරි දැක්මක් සහිත වන අතර දත්ත මත පදනම් වේ. මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග සමස්ත ආර්ථිකයට, විශේෂයෙන් උද්ධමනය කෙරෙහි, බලපෑමක් ඇති කිරීමට කාලයක් ගතවන බැවින් ඉදිරි දැක්මක් සහිත ප්‍රවේශයක් අත්‍යවශ්‍ය වේ. සුදුසු මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය තීරණය කිරීම සඳහා මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය වසරකට සය වතාවක් රැස් වේ. මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය සිය තීරණ ගැනීමේ දී වත්මන් උද්ධමනය සහ එහි ඉදිරි දැක්ම, ආර්ථික තත්ත්වය සහ අනාගත ආර්ථික අපේක්ෂා මෙන්ම එවැනි පුරෝකථන හා සම්බන්ධ අවදානම් හා අවිනිශ්චිතතා පිළිබඳව ද ඇගැයීමක් සිදු කරයි. මෙම ඇගයීමේ දී පුරෝකථනය කළ මූලික ගෝලීය ආර්ථික ප්‍රවණතා, අවිනිශ්චිතතා සහ ඉදිරි දැක්ම පිළිබඳව ද සැලකිල්ලට ගනු ලබයි. මෙම රැස්වීම්වල දී සැලකිල්ලට ගනු ලබන පුරෝකථන, පවතින දත්ත, ප්‍රධාන සාර්ව ආර්ථික විචල්‍යයන්ගේ කෙටි කාලීන පුරෝකථන සහ ගෝලීය ආර්ථික දර්ශකවලට අදාළ පුරෝකථන මෙන් ම කාර්ය මණ්ඩල විනිශ්චයන් මත පදනම් වේ. මහ බැංකු අධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් යුතු අභ්‍යන්තර කමිටුවක් වන මුදල් ප්‍රතිපත්ති කමිටුව සවිස්තරාත්මක තාක්ෂණික ඇගයීම් සහ ප්‍රතිපත්ති සාකච්ඡාවලින් අනතුරුව  මුදල් ප්‍රතිපත්ති මණ්ඩලයේ සලකා බැලීම සඳහා ප්‍රතිපත්ති නිර්දේශ සපයයි.

නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුවේ වැදගත් අංගයක් වන මුදල් ප්‍රතිපත්ති වාර්තාව, මහ බැංකු පනතේ 27 සහ 80 යන වගන්ති ප්‍රකාරව සකස් කර ඇත. මෙම වගන්තිවලට අනුව වත්මන් උද්ධමන ප්‍රවණතා, උද්ධමනය සඳහා බලපාන සාධක, මැදි කාලීන උද්ධමන පුරෝකථන, ඒ සඳහා ඇති ප්‍රධාන අවදානම් මෙන්ම මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සහ එහි අරමුණු ළඟා කරගැනීම පිළිබඳව විස්තර කෙරෙන වාර්තාවක් වසරකට දෙවරක් ප්‍රකාශයට පත් කිරීම අවශ්‍ය වේ. මෙම  වාර්තාව මහ බැංකුවේ ප්‍රතිපත්තිවල විනිවිදභාවය, වගවීම  සහ විශ්වසනීයභාවය පිළිබිඹු කරන සාක්ෂියක් ලෙස කටයුතු කරයි. මීට අමතරව, මෙම වාර්තාව හරහා දේශීය ආර්ථිකයේ මෙන්ම ගෝලීය ආර්ථිකයේ වත්මන් ආර්ථික තත්ත්වය පිළිබඳව මහජන අවබෝධය වැඩි කිරීමට කටයුතු කරන අතර ම, ආර්ථික වර්ධන ඉදිරි දැක්ම සමඟ ඒ හා සම්බන්ධ අවදානම් පිළිබඳ තක්සේරුවක් සපයයි.

රූප සටහන 01: ශ්‍රී ලංකාවේ මුදල් ප්‍රතිපත්ති තීරණ ගැනීමේ ක්‍රියාවලිය *(වසරකට සය වතාවක්)*



## සාරාංශය

2026 වසරේ පෙබරවාරි මස අග භාගයේ සිට මැදපෙරදිග කලාපයේ පවතින භූ දේශපාලනික ආතතීන් උත්සන්න වීම හේතුවෙන් විදේශීය අංශය දැඩි අභියෝගකාරී තත්ත්වයන්ට මෙන්ම ඉහළ විචලනයන්ට මුහුණ දුන් අතර, එහි බලපෑම් දේශීය ආර්ථිකයට එල්ල වීම මධ්‍යයේ වුව ද, 2026 වසරේ මේ දක්වා කාලය තුළ ශ්‍රී ලංකාවේ සාර්ව ආර්ථික තත්ත්වයන් බොහෝදුරට ඔරොත්තු දීමේ හැකියාවක් පෙන්නුම් කළේය.

2026 වසරේ පළමු කාර්තුවේ දී 2%කට ආසන්න සාමාන්‍ය අගයක පැවති මතුපිට උද්ධමනය එතැන් සිට සීඝ්‍රයෙන් ඉහළ ගොස් උද්ධමන ඉලක්කයට වඩා ඉහළ මට්ටමකට ළඟා වූ අතර, මේ සඳහා ගෝලීය බලශක්ති මිල ගණන් ඉහළ යෑමේ බලපෑම දේශීය ඉන්ධන සහ බලශක්ති මිල ගණන් වෙත ක්ෂණිකව සම්ප්‍රේෂණය වීම සහ ඒ මගින් අනෙකුත් අංශවලට එල්ල වූ වක්‍ර බලපෑම් ප්‍රධාන වශයෙන් හේතු විය. මෑත කාලීනව උද්ධමනය ඉහළ යෑම සඳහා ප්‍රධාන වශයෙන් සැපයුම් අංශයේ සාධක හේතු වූ අතර, ණය සහ ණය මත පදනම් වූ ආනයන කැපී පෙනෙන ලෙස ඉහළ යෑමෙන් පෙන්නුම් කෙරෙන පරිදි දේශීය ඉල්ලුම් තත්ත්වයන් ශක්තිමත් වීම ද යටිදැරි උද්ධමන පීඩන සඳහා දායක වී ඇත. ඒ අනුව, මතුපිට උද්ධමනය නුදුරු කාලීනව ඉලක්කගත මට්ටම ඉක්මවා ඉහළ යාමෙන් අනතුරුව, සැපයුම් අංශයේ මෑත කාලීන කම්පනවල බලපෑම් පහළ යෑමත් මුදල් ප්‍රතිපත්ති දැඩි කිරීමේ බලපෑම සමස්ත ආර්ථිකය වෙත සම්ප්‍රේෂණය වීමත් සමඟ උද්ධමනය මැදි කාලීනව ක්‍රමයෙන් අඩු වී ඉලක්කගත මට්ටමට ළඟා වනු ඇතැයි පුරෝකථනය කෙරේ. මූලික උද්ධමනය ද ඉහළ ගොස් මතුපිට උද්ධමන ඉලක්කය වටා ස්ථායී වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මේ අතර, ගෝලීය වෙළඳ භාණ්ඩ වෙළඳපොළ තුළ පවතින ඉහළ අවිනිශ්චිතතාව සහ එල් නිනෝ සංසිද්ධිය සමඟ ඇතිවිය හැකි අහිතකර කාලගුණික තත්ත්වයන්ගේ බලපෑම හේතුවෙන්, නුදුරු සහ මැදි කාලීනව උද්ධමනය පුරෝකථනය කළ මට්ටමට වඩා ඉහළ යෑමේ අවධානමක් පවතී. කෙසේ වුවද, උද්ධමන අපේක්ෂාවන් මැදි කාලීනව උද්ධමන ඉලක්කය වටා ස්ථායීව පවතී.

ඉහළ උද්ධමන ඉදිරි දැක්ම මධ්‍යයේ, උද්ධමනය තවදුරටත් ඉහළ යෑම පාලනය කිරීම සහ උද්ධමන අපේක්ෂා ඉලක්කගත මට්ටමෙන් විතැන් වීමේ අවදානම අවම කිරීම සඳහා, මහ බැංකුව, 2023 වසරේ මැද භාගයේ සිට ක්‍රියාත්මක කළ සිය ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය අවසන් කරමින් 2026 වසරේ මැයි මාසයේ දී මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය දැඩි කිරීමට කටයුතු කළේය. ඒ අනුව, ප්‍රතිපත්ති පොලී අනුපාතික දැඩි කිරීමට අනුකූලව සමස්ත වෙළඳපොළ පොලී අනුපාතික ව්‍යුහය ද ඉහළ ගියේය. ආර්ථික ක්‍රියාකාරකම්වල අඛණ්ඩ ඉහළ යාම සහ ඉහළ ආනයන ඉල්ලුම පිළිබිඹු කරමින් අඛණ්ඩව ශක්තිමත් වර්ධනයක් වාර්තා කළ පෞද්ගලික අංශය වෙත ලබා දෙන ණයෙහි ප්‍රසාරණය, මූල්‍ය තත්ත්වයන් දැඩි වීම සහ මහ බැංකුව හා රජය විසින් ගනු ලැබූ අනෙකුත් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග හේතුවෙන් ඉදිරි කාලයේ දී මන්දගාමී වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

අඛණ්ඩව වසර තුනක් අතිරික්තයක් වාර්තා කළ විදේශීය ජංගම ගිණුම, මැදපෙරදිග කලාපයේ නොසන්සුන්තාව තීව්‍ර වීම සහ මෝටර් රථ ආනයනය ඉහළ යෑම හේතුවෙන් 2026 වසරේ පළමු භාගයේ දී හිඟයක් වාර්තා කිරීමත් සමඟ විදේශීය අංශයේ ඔරොත්තු දීමේ හැකියාව යම් අභියෝගයකට ලක් විය. විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ ලැබීම් ශක්තිමත්ව පැවතිය ද, ඉන්ධන ආනයන වියදම් ඉහළ යෑම සහ සංචාරක ඉපැයීම් පහළ යෑම විදේශීය ජංගම ගිණුමේ හිඟයට ප්‍රධාන වශයෙන් දායක විය. 2026 වසරේ මුල් කාලයේ දී බොහෝ දුරට ස්ථායීව පැවති ශ්‍රී ලංකා රුපියල, මැදපෙරදිග කලාපයේ අර්බුද තීව්‍ර වීමත් සමඟ 2026 වසරේ මාර්තු සිට ජූනි දක්වා කාලය

තුළ අවප්‍රමාණය වීමේ පීඩනයකට මුහුණ දුන්නේය.[3] විදේශ සංචිත ස්වාරක්ෂක ගොඩනැංවීමේ සහ පවත්වාගෙන යෑමේ ප්‍රයත්න අඛණ්ඩව ක්‍රියාත්මක වුව ද අභියෝගාත්මක ගෝලීය තත්ත්ව සහ අඛණ්ඩ විදේශ ණය සේවාකරණය හේතුවෙන් දළ නිල සංචිත 2026 ජූනි මාසය අවසානයේදී පහළ ගියේය. කෙසේ වුව ද, බහුපාර්ශ්වීය ආයතනවලින් ලද විදේශ විනිමය ලැබීම් හේතුවෙන් දළ නිල සංචිත පහළ යෑම කිසියම් දුරකට පාලනය විය.

අඛණ්ඩව ක්‍රියාත්මක කළ ආදායම් පාදක කරගත් රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාමාර්ග හේතුවෙන් 2026 වසරේ මුල් මාස පහ තුළ රාජ්‍ය මූල්‍ය අංශයේ කාර්යසාධනය අඛණ්ඩව ශක්තිමත් විය.

2024 සහ 2025 වසරවල දී අඛණ්ඩව 5.0%ක වර්ධනයක් වාර්තා කිරීමෙන් අනතුරුව, ශ්‍රී ලංකා ආර්ථිකය 2026 වසරේ පළමු කාර්තුවේ දී මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ 5.1%ක ශක්තිමත් වර්ධනයක් වාර්තා කළ අතර ඒ සඳහා ශක්තිමත් සාර්ව ආර්ථික පදනම, ආර්ථිකයේ වැඩි දියුණු වූ ඔරොත්තු දීමේ හැකියාව සහ වසරේ මුල් භාගයේ දී දක්නට ලැබුණු හිතකර මූල්‍ය තත්ත්වයන් සහාය වී ඇත. ප්‍රමුඛ ආර්ථික දර්ශක මගින් ද ආර්ථිකයේ අඛණ්ඩ වර්ධන ප්‍රවණතාව පෙන්නුම් කළේය. කෙසේ වුව ද, භූ දේශපාලනික අර්බුදකාරී තත්ත්වයන් නැවත ඇති වීම සහ ඒ ආශ්‍රිතව ගෝලීය ආර්ථිකයට ඇති විය හැකි වෙළඳ භාණ්ඩ මිල කම්පන, වෙළඳ කටයුතුවලට බාධා එල්ල වීම සහ ගෝලීය ඉල්ලුම මන්දගාමී වීම වැනි බලපෑම් මෙන්ම, දේශීය වශයෙන් ඇතිවිය හැකි අහිතකර කාලගුණික තත්ත්වයන් තුළින් ඉදිරි කාලයේ දී දේශීය ආර්ථික කාර්යසාධනය කෙරෙහි අඛණ්ඩව බලපෑම් ඇති විය හැකිය.

[3] 2026 අගෝස්තු 12 වනවිට ශ්‍රී ලංකා රුපියල එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව 7.4% කින් අවප්‍රමාණය වී ඇත.

# 1. මුදල් ප්‍රතිපත්ති සාරාංශය

2026 වසරේ මාර්තු මස පැවති මෙම වසර සඳහා වන දෙවන මුදල් ප්‍රතිපත්ති සමාලෝචනයේ දී, මැදපෙරදිග පවත්නා යුද තත්ත්වයේ අවිනිශ්චිත වාතාවරණය මධ්‍යයේ මහ බැංකුව එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය නොවෙනස්ව පවත්වාගෙන යාමට තීරණය කළේය. ඒ වනවිට උද්ධමනය, 5%ක ඉලක්කයට සාපේක්ෂව අඩු මට්ටමක පැවති අතර, ඉහළ බලශක්ති මිල සහ එමගින් උද්ධමනයට වන බලපෑම් අවශෝෂණය කරගැනීමට ඒ තුළින් යම් ප්‍රතිපත්තිමය අවකාශයක් නිර්මාණය වී තිබිණි. එම තත්ත්වය, ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය නොවෙනස්ව පවත්වා ගැනීමේ තීරණයට සහායක් විය.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2023 වසරේ ජූනි මස සිට ක්‍රියාත්මක වූ ලිහිල් මුදල් ප්‍රතිපත්ති කාල සීමාව අවසන් කරමින්, 2026 වසරේ මැයි මාසයේ දී සිය මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය දැඩි කරන ලදී. 2026 වසරේ පෙබරවාරි මස අවසානයේ සිට මැදපෙරදිග යුද වාතාවරණය තීව්‍ර වීම මගින් ඇතිවූ අහිතකර වක්‍ර බලපෑම් හේතුවෙන් උද්ධමන අපේක්ෂා ඉහළ යෑම, පෞද්ගලික අංශයේ ණය සහ ණය මත පදනම් ආනයනවල අඛණ්ඩව ඉහළ යෑම මෙන්ම, ප්‍රමුඛ ආර්ථික දර්ශක මගින් පෙන්නුම් කෙරෙන වැඩිදියුණු වූ දේශීය ආර්ථික ක්‍රියාකාරකම් මගින් පිළිබිඹු වන දේශීය ඉල්ලුම ක්‍රමයෙන් ශක්තිමත් වීම සැලකිල්ලට ගනිමින් 2026 වසරේ මැයි මාසයේ දී එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය ප්‍රතිශතාංක 1කින් 8.75%ක් දක්වා ඉහළ දමන ලදී. ඊට අමතරව, විදේශීය අංශයේ පීඩන ඉහළ යාම, බලශක්ති මිල සංශෝධන හේතුවෙන් උද්ධමනය මත ඇතිවිය හැකි දෙවන අදියරේ බලපෑම් සහ උද්ධමන අපේක්ෂා විතැන් වීමේ අවදානම ද සැලකිල්ලට ගනිමින් වඩාත් දැඩි සහ ආරක්ෂාකාරී මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයක් අනුගමනය කරන ලදී.

2026 වසරේ මැයි මාසයේ දී ක්‍රියාත්මක කරන ලද මුදල් ප්‍රතිපත්ති දැඩි කිරීමේ ක්‍රියාමාර්ගවල බලපෑම ආර්ථිකයට ක්‍රමයෙන් සම්ප්‍රේෂණය වීම සඳහා ප්‍රමාණවත් කාලයක් ලබා දීමේ අරමුණින් යුතුව 2026 වසරේ ජූලි මස පැවති මුදල් ප්‍රතිපත්ති වාරයේ දී ප්‍රතිපත්ති පොලී අනුපාතිකය නොවෙනස්ව පවත්වාගෙන යෑමට මහ බැංකුව තීරණය කරන ලද අතර, ප්‍රතිපත්ති පොලී අනුපාතිකය ඉහළ දැමීමේ බලපෑම ආර්ථිකය වෙත සම්ප්‍රේෂණය වීමත් සමඟ ඉදිරියේ දී ණය වර්ධනය සහ ඉල්ලුම් පීඩන අවම කිරීම අපේක්ෂා කෙරේ. මෑත කාලීනව උද්ධමනයේ ඉහළ යාම වේගවත් වුවද උද්ධමන අපේක්ෂා ඉලක්කය වටා බොහෝ දුරට ස්ථායීව පැවති අතර, විදේශීය අංශයේ පීඩන තරමක් ලිහිල් වීම හේතුවෙන් ප්‍රතිපත්ති පොලී අනුපාතිකය දැනට පවත්නා මට්ටමේ ම නොවෙනස්ව පවත්වා ගැනීමට අවකාශ සැලසුණි. කෙසේ වෙතත්, වේගයෙන් වෙනස්වන ගෝලීය භූදේශපාලනික තත්ත්ව සහ ඒ මගින් ඇතිවන ගෝලීය ආර්ථික අවිනිශ්චිතතා, දේශීය උද්ධමන අපේක්ෂා කෙරෙහි අඛණ්ඩව අවදානම් මතු කරමින් පවතින බැවින් මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ දී අඛණ්ඩව සුපරීක්ෂාකාරී වීම අවශ්‍ය වේ.

මෙම වසරේ පස්වන මුදල් ප්‍රතිපත්ති විවරණය සඳහා මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය 2026 වසරේ සැප්තැම්බර් මස දී රැස්වෙනු ඇත.

**පසුගිය මුදල් ප්‍රතිපත්ති වාර්තාවෙන් පසු ගනු ලැබූ මුදල් ප්‍රතිපත්ති තීරණ**

**(2026 පෙබරවාරි –2026 ජූලි)**

**අංක 02 2026**

**2026 මාර්තු**

එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය 7.75% මට්ටමේ පවත්වාගෙන යන ලදී

**අංක 03 2026**

**2026 මැයි**

එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය ප්‍රතිශතාංක 1කින් 8.75% දක්වා වැඩි කරන ලදී

**අංක 04 2026**

**2026 ජූලි**

එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය 8.75% මට්ටමේ පවත්වාගෙන යන ලදී

# 2. උද්ධමනයේ සහ ආර්ථිකයේ ඉදිරි දැක්ම

උද්ධමනය සහ මූර්ත ආර්ථික වර්ධනය පිළිබඳ පුරෝකථන කෙරෙහි අවධානය යොමු කරමින්, 2026 වසරේ ජූලි මාසයේ දී එළඹුණු මුදල් ප්‍රතිපත්ති තීරණයට සහාය දැක්වීම සඳහා මහ බැංකු කාර්යමණ්ඩලය විසින් ඉදිරිපත් කරන ලද මැදි කාලීන සාර්ව ආර්ථික පුරෝකථන, මුදල් ප්‍රතිපත්ති වාර්තාවේ මෙම කොටසේ සාරාංශ කර දක්වා ඇත.[4] මෙම පුරෝකථන මගින්, 2026 වසරේ ජූලි මස මුදල් ප්‍රතිපත්ති වාරයේ දී පැවති දත්ත, ප්‍රධාන විචල්‍යයන්හි නුදුරු කාලීන පුරෝකථන, ගෝලීය සාර්ව ආර්ථික පුරෝකථන සහ උපකල්පන හා කාර්යමණ්ඩල විනිශ්චයන් පිළිබිඹු කෙරෙන අතර, මෙම පුරෝකථන මෙම වාර්තාවෙහි මූලික පුරෝකථන ලෙස සැලකේ.

මැදපෙරදිග කලාපයේ නිරන්තර වෙනස්වන වාතාවරණය සහ එමගින් ගෝලීය මෙන්ම දේශීය ආර්ථික ක්‍රියාකාරකම් කෙරෙහි එල්ලවන පුළුල් වක්‍ර බලපෑම් හේතුවෙන්, වත්මන් සාර්ව ආර්ථික පුරෝකථන සඳහා ඉහළ අවිනිශ්චිතතාවයක් පවතී. ඒ අනුව, පුරෝකථන සඳහා පදනම් වූ තත්ත්වයන්හි සැලකිය යුතු වෙනස්කම් සිදුවුවහොත් මෙම පුරෝකථනවලින් සැලකිය යුතු අපගමනයක් සිදු විය හැකිය.

## 2.1. මූලික පුරෝකථන

මතුපිට උද්ධමනය නුදුරු කාලීනව 5%ක ඉලක්කගත මට්ටමට වඩා ඉහළ මට්ටමක පවතිනු ඇතැයි අපේක්ෂා කෙරෙන අතර, සුදුසු ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ගවල සහාය ඇතිව, මැදි කාලීනව උද්ධමනය ඉලක්කගත මට්ටමේ ස්ථායී වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෙම අපේක්ෂිත උද්ධමන ගමන් මග, මැදපෙරදිග කලාපයේ අර්බුදකාරී තත්ත්වයේ බලපෑම් සහ එමගින් ඇති කරන වක්‍ර බලපෑම් තාවකාලික මෙන්ම ක්‍රමයෙන් පහව යනු ඇතැයි යන උපකල්පනය මත පදනම් වේ. මේ අතර, මැදපෙරදිග කලාපයේ භූ දේශපාලනික අර්බුදකාරී තත්ත්ව හේතුවෙන් ඇතිවන ආර්ථික බලපෑම්වල තීව්‍ර බව පෙර අපේක්ෂා කළ මට්ටමට වඩා අඩු වීම මධ්‍යයේ නුදුරු කාලීන වර්ධන අපේක්ෂා වැඩිදියුණු වීමත් සමඟ ආර්ථික වර්ධන ඉදිරි දැක්ම සාපේක්ෂ වශයෙන් ස්ථායීව පවතී. ඒ අනුව, පෙර වසරවල දී වාර්තා කළ ආර්ථික වර්ධන ප්‍රවණතාව අඛණ්ඩව පවත්වා ගනිමින් 2026 වසරේ ආර්ථික වර්ධනය 4% සිට 5% දක්වා පරාසයේ පවතිනු ඇතැයි පුරෝකථනය කෙරේ. දේශීය ඉල්ලුම වැඩිදියුණු වීම සහ අඛණ්ඩ සාර්ව ආර්ථික ස්ථායීතාව මැදි කාලීනව ආර්ථික වර්ධනය සඳහා සහාය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. කෙසේ වුවද, භූ දේශපාලනික ප්‍රවණතා සහ වෙනස් වන දේශීය සහ විදේශීය තත්ත්ව මෙන්ම දේශගුණික අවදානම් මගින් ඇතිවිය හැකි බලපෑම් හේතුවෙන් ඉදිරි දැක්ම පිළිබඳ තවදුරටත් ඉහළ අවිනිශ්චිතතා පවතී.

[4] මැදි කාලීන සාර්ව ආර්ථික පුරෝකථන සිදු කිරීම සඳහා මහ බැංකුව විසින් අර්ධ ව්‍යුහාත්මක සාර්ව ආර්ථික ආකෘතියක් වන කාර්තුමය පුරෝකථන ආකෘතිය (Quarterly Projection Model) භාවිත කරනු ලැබේ. සෑම මුදල් ප්‍රතිපත්ති වාරයකම මෙම පුරෝකථන යාවත්කාලීන කරනු ලබන අතර, ඒ සඳහා, ගෝලීය සාර්ව ආර්ථික පුරෝකථන සහ ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන මාසික උද්ධමන දත්ත සහ දළ දේශීය නිෂ්පාදිතයේ කාර්තුමය දත්ත ද ඇතුළුව, නමුත් එම දත්තවලට පමණක් සීමා නොවන, නවතම ආර්ථික ප්‍රවණතා පිළිබඳ දත්ත සහ තොරතුරු භාවිත කෙරේ. ආකෘතික යටිතල පහසුකම් අඛණ්ඩව වැඩිදියුණු කිරීමේ ක්‍රියාවලියෙහි කොටසක් ලෙස, වෙනස්වන ආර්ථික තත්ත්වයන් පිළිබිඹු කිරීම සඳහා කාර්තුමය පුරෝකථන ආකෘතිය සාමාන්‍යයෙන් වසර ආරම්භයේ දී අවශ්‍යතාවය අනුව සමාලෝචනය කරනු ලැබේ.

**උද්ධමනය පිළිබඳ ඉදිරි දැක්ම**

මුදල් ප්‍රතිපත්ති රාමුව පිළිබඳ ගිවිසුම[5] මගින් නියම කර ඇති ආන්තිකයට වඩා වැඩි ප්‍රමාණයකින් උද්ධමන ඉලක්කයට වඩා පහළින් උද්ධමනය පැවති කාර්තු අටක කාලපරිච්ඡේදය අවසන් කරමින්, කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කො.පා.මි.ද., 2021=100) මත පදනම් වූ කාර්තුමය මතුපිට උද්ධමනයේ සාමාන්‍යය 2026 වසරේ දෙවන කාර්තුවේ දී 5.9%ක් විය.

**රූප සටහන 02: කාර්තුමය මතුපිට උද්ධමනයේ මූලික පුරෝකථන (කො.පා.මි.ද., වාර්ෂික ලක්ෂ්‍යමය)**
**2026 වසරේ ජූලි මස මුදල් ප්‍රතිපත්ති වාරයේ පුරෝකථන මත පදනම්ව**




**2023 ඔක්තෝබර් මාසයේ දී මහ බැංකුව සහ මුදල් අමාත්‍යවරයා අතර අත්සන් කරන ලද මුදල් ප්‍රතිපත්ති රාමුව පිළිබඳ ගිවිසුම යටතේ උද්ධමන ඉලක්කය (5%) සඳහා එකඟ වී ඇත.*

*සටහන: උද්ධමන ව්‍යාප්ති සටහනෙහි වාර්තා කරන ලද දත්ත කො.පා.මි.ද. (2021=100, ඍතුමය වශයෙන් වන බලපෑම් ඉවත් කරන ලද) මත පදනම් වේ.*

මූලය: ශ්‍රී ලංකා මහ බැංකු කාර්යමණ්ඩල පුරෝකථන

[5] 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 26(5) වගන්තිය අනුව, අනුක්‍රමික කාර්තු දෙකක් තුළ දී උද්ධමන ඉලක්කය එකඟ වී ඇති ආන්තිකය තුළ පවත්වා ගැනීමට මහ බැංකුව අපොහොසත් වුවහොත්, මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය විසින් උද්ධමන ඉලක්කය සාක්ෂාත් කර ගැනීමට අපොහොසත් වීමට හේතු, මහ බැංකුව විසින් ක්‍රියාත්මක කිරීමට යෝජිත ප්‍රතිකර්මීය ක්‍රියාමාර්ග සහ උද්ධමන ඉලක්කය සපුරා ගැනීමට ගතවන කාල සීමාව පිළිබඳ ඇස්තමේන්තුවක් සහිත වාර්තාවක් මහජනතාවට ද ලබාගත හැකි අයුරින් ඉදිරිපත් කළ යුතුය. 2023 වසරේ ඔක්තෝබර් මාසයේ දී අත්සන් කරන ලද මුදල් ප්‍රතිපත්ති රාමුව පිළිබඳ ගිවිසුමට අනුව, උද්ධමන ඉලක්කය සහ ආන්තිකය, පිළිවෙළින්, 5%ක් සහ ප්‍රතිශතාංක ±2ක් ලෙස තීරණය කර ඇත.

**සටහන: පුරෝකථනයක් යනු පොරොන්දුවක් හෝ බැඳීමක් නොවේ**

2026 වසරේ ජූලි මාසයේ මුදල් ප්‍රතිපත්ති වාරයේ දී පැවති දත්ත, උපකල්පන සහ විනිශ්චයන් පුරෝකථන මගින් පිළිබිඹු කෙරේ. ගෝලීය බලශක්ති සහ ආහාර මිල පිළිබඳ වන පුරෝකථන; ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වන ශ්‍රී ලංකාවේ ප්‍රධාන වෙළඳ හවුල්කරුවන්ගේ ආර්ථික වර්ධනය; රජයේ අපේක්ෂිත රාජ්‍ය මූල්‍ය ඉදිරි දැක්ම; සහ එක්සත් ජනපද මුදල් ප්‍රතිපත්ති පොලී අනුපාතිකය මගින් නිරූපණය වන ගෝලීය මූල්‍ය තත්ත්ව යනාදී කරුණු මත මෙම පුරෝකථන රඳා පවතී. තවද, ආර්ථික ආකෘති සමඟ අනුකූල වන පොලී අනුපාතික මාර්ගය සහ එහි ප්‍රතිඵලයක් ලෙස ඇති වන විනිමය අනුපාතිකය ද ඇතුළු සාර්ව ආර්ථික විචලනයන්හි හැසිරීම මත පුරෝකථන රඳා පවතී. තවද, මූලික පුරෝකථනවල දී ප්‍රධාන සාර්ව ආර්ථික ප්‍රතිපත්තිවලින් විශාල වශයෙන් විතැන් වීමක් අපේක්ෂා නොකෙරේ. එබැවින්, ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන අඛණ්ඩව පවත්වාගෙන යෑම සහ රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ප්‍රයත්න මෙමගින් ගම්‍ය වේ. මෙම උපකල්පනවලින් සැලකිය යුතු ලෙස අපගමනය වීම සැබෑ උද්ධමනය, පුරෝකථනය කළ මාර්ගයෙන් අපගමනය වීමට හේතු විය හැකිය. උද්ධමන ව්‍යාප්ති සටහන් සමඟ මැදි කාලීන සාර්ව ආර්ථික පුරෝකථන එක් එක් මුදල් ප්‍රතිපත්ති වාරය තුළ අඛණ්ඩව යාවත්කාලීන කෙරේ. වෙනස්වන ගෝලීය පරිසරය සහ දේශීය ආර්ථිකයේ ඇති අවිනිශ්චිතතා හමුවේ, සැබෑ දත්ත මූලික පුරෝකථනවලට වඩා ඉහළ යෑම සඳහා මෙන්ම පහළ යෑම සඳහා අවදානම් පවතී. මූලික පුරෝකථන සම්බන්ධයෙන් ඇති අවදානම් පිළිබඳ විස්තර "වාර්තා වන සැබෑ දත්ත මූලික පුරෝකථනවලින් අපගමනය වීමට ඇති අවදානම්" කොටසේ දී සාකච්ඡා කෙරේ.

ප්‍රධාන වශයෙන්, බලශක්ති සහ ප්‍රවාහන උද්ධමනය ඉහළ යෑම, විනිමය අනුපාතිකය වෙනස්වීමේ බලපෑම් ආනයනික මිල ගණන් වෙත සම්ප්‍රේෂණය වීම මෙන්ම නිතර මිල උච්චාවචනය වන ආහාර උද්ධමනය ඉහළ යෑම සහ එහි සංඛ්‍යානමය පදනම් බලපෑම හේතුවෙන් මතුපිට උද්ධමනය නුදුරු කාලයේ දී ඉලක්කගත මට්ටමට වඩා ඉහළ අගයක පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ. ඉන් අනතුරුව, මතුපිට උද්ධමනය ඉලක්කගත මට්ටම දක්වා ක්‍රමයෙන් පහළ යනු ඇතැයි පුරෝකථනය කෙරෙන අතර, එය මැදපෙරදිග කලාපයේ අර්බුදකාරී තත්ත්වයේ බලපෑම් සහ එමගින් ඇති කරන වක්‍ර බලපෑම් තාවකාලික මෙන්ම ක්‍රමයෙන් පහව යනු ඇතැයි යන උපකල්පනය මත පදනම් වේ. සුදුසු ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ගවල සහාය ඇතිව, මතුපිට උද්ධමනය මැදි කාලීනව ඉලක්කගත මට්ටම වටා ස්ථායී වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

මතුපිට උද්ධමනයේ පුරෝකථනයන්ට අනුකූලව යමින්, ආර්ථිකයේ යටිදැරි ඉල්ලුම් තත්ත්ව පිළිබිඹු කරන මූලික උද්ධමනය යම් ක්‍රමානුකූල ඉහළ යෑමක් පෙන්නුම් කර, මැදි කාලීනව මතුපිට උද්ධමන ඉලක්කය ආසන්නයේ පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ. නුදුරු කාලීන මූලික උද්ධමනය සඳහා ගෝලීය ආහාර මිල ගණන් සහ ගෝලීය උද්ධමන ප්‍රවණතාවල වක්‍ර බලපෑම් ඇතුළුව ආනයනික උද්ධමනය මෙන්ම බලශක්ති සහ ප්‍රවාහන උද්ධමනයේ බලපෑම් ආර්ථිකය වෙත සම්ප්‍රේෂණය වීම ප්‍රධාන වශයෙන් හේතු වනු ඇතැයි අපේක්ෂිතය.

**රූප සටහන 03: කාර්තුමය මූලික උද්ධමනයේ මූලික පුරෝකථන (කො.පා.මි.ද., වාර්ෂික ලක්ෂ්‍යමය)**
**2026 වසරේ ජූලි මුදල් ප්‍රතිපත්ති වාරයේ පුරෝකථන මත පදනම්ව**




*සටහන: උද්ධමන ව්‍යාප්ති සටහනෙහි වාර්තා කරන ලද දත්ත කො.පා.මි.ද. (2021=100, ඍතුමය වශයෙන් වන බලපෑම් ඉවත් කරන ලද) මත පදනම් වේ.*
ඉහත 02 රූප සටහනෙහි පැහැදිලි කිරීමේ සටහන බලන්න.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකු කාර්යමණ්ඩල පුරෝකථන

ඉන්ධන, විදුලි ගාස්තු සහ එල්.පී. ගෑස් මිල ගණන් ඉහළ දැමීමත් සමඟ 2026 වසරේ දෙවන කාර්තුව තුළ සැලකිය යුතු ලෙස ඉහළ ගිය බලශක්ති සහ ප්‍රවාහන උද්ධමනය 2026 වසරේ ජූලි මාසයේ දී ඉන්ධන සහ එල්.පී. ගෑස් මිල ගණන් පහළ දැමීමත් සමඟ තරමක් දුරට පහළ ගියේය. නුදුරු කාලීනව බලශක්ති සහ ප්‍රවාහන උද්ධමනය ඉහළ මට්ටමක පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ. කාලගුණය ආශ්‍රිත අවිනිශ්චිතතා ද විදුලි උත්පාදන පිරිවැය ඉහළ යෑම හරහා බලශක්ති උද්ධමනයේ ඉදිරි දැක්ම කෙරෙහි බලපෑම් ඇති කරනු ඇත. මැදපෙරදිග අර්බුදකාරී තත්ත්වයේ බලපෑම් සහ එමගින් ඇති කරන වක්‍ර බලපෑම් තාවකාලික මෙන්ම ක්‍රමයෙන් පහව යනු ඇතැයි යන උපකල්පනය මත පදනම්ව, පුරෝකථන කාල සීමාවේ ඉතිරි කාලය තුළ බලශක්ති සහ ප්‍රවාහන උද්ධමනය ක්‍රමයෙන් පහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**රූප සටහන 04: බලශක්ති සහ ප්‍රවාහන උද්ධමනය: මිලෙහි ගතික බලපෑම හා පදනම් බලපෑම (කො.පා.මි.ද., 2021=100)**[6]




මූලය: ශ්‍රී ලංකා මහ බැංකු කාර්යමණ්ඩල ගණනය කිරීම්

නිතර මිල උච්චාවචනය වන ආහාර උද්ධමනය නුදුරු කාලීනව ඉහළ මට්ටමක පවතිනු ඇතැයි ද මැදි කාලීනව ක්‍රමයෙන් පහළ යනු ඇතැයි ද පුරෝකථනය කෙරේ. 2026 වසරේ ජූනි මාසයේ දී නිරීක්ෂණය වූ නිතර මිල උච්චාවචනය වන ආහාර මිල ගණන්, විශේෂයෙන් එළවළු සහ මත්ස්‍ය මිල ගණන්, ඉහළ යෑම මෙන්ම ඉහළ ප්‍රවාහන වියදම් හේතුවෙන් නුදුරු කාලීන ආහාර උද්ධමනය කෙරෙහි ඉහළ පීඩන ඇති වනු ඇතැයි අපේක්ෂා කෙරේ. කෙසේ වෙතත්, නිතර මිල උච්චාවචනය වන ආහාර උද්ධමනයේ ඉදිරි දැක්ම කෙරෙහි කාලගුණය ආශ්‍රිත අවිනිශ්චිතතා මගින් බලපෑම් එල්ලවනු ඇති අතර, එමගින් මිල උච්චාවචනය වීම් අපේක්ෂා කළ ප්‍රමාණයට වඩා වැඩි විය හැකිය. කෙසේ වෙතත්, එවැනි තත්ත්වයන්ගේ අහඹු ස්වභාවය හේතුවෙන් එම ප්‍රවණතා පුරෝකථන සඳහා යොදාගැනීමට අසීරු වන අතර ඒවා මෙම පුරෝකථන සාක්ෂාත් කරගැනීම හා සම්බන්ධ අවදානම් ලෙස සැලකේ.

**රූප සටහන 05: මතුපිට උද්ධමනය: මිලෙහි ගතික බලපෑම හා පදනම් බලපෑම (කො.පා.මි.ද. 2021=100)**[6]




මූලය: ශ්‍රී ලංකා මහ බැංකු කාර්යමණ්ඩල ගණනය කිරීම්

[6] මිලෙහි ගතික බලපෑම හා පදනම් බලපෑම පිළිබඳ සවිස්තරාත්මක විමසීමක් සඳහා කරුණාකර 2025 වසරේ අගෝස්තු මස මුදල් ප්‍රතිපත්ති වාර්තාවේ විශේෂ සටහන (අ) බලන්න.

**උද්ධමන අපේක්ෂා**

මහ බැංකුව විසින් සිදු කළ උද්ධමන අපේක්ෂා පිළිබඳ සමීක්ෂණයට අනුව, 2026 වසරේ පළමු භාගය තුළ දී ආයතනික අංශයේ උද්ධමන අපේක්ෂා ප්‍රමාණ අනුව වෙනස් වුවද, සියලුම කාල සීමා සඳහා උද්ධමන අපේක්ෂා ඉහළ ගොස් ඇත. 2026 වසරේ ජනවාරි මාසයේ සිට ජූනි මාසය දක්වා කාලයේ දී, ඉදිරි මාස 3ක සහ අවුරුද්දක කාලය ආවරණය කරන කෙටි කාලීන උද්ධමන අපේක්ෂා සැලකිය යුතු ලෙස ඉහළ ගිය අතර, එම කාලය තුළ සැබෑ උද්ධමනයේ ප්‍රවණතා එමගින් පිළිබිඹු කෙරුණි. විශේෂයෙන්, මතුපිට උද්ධමනය වසරේ මුල් කාලයේ දී සාපේක්ෂ වශයෙන් පහළ ස්ථායී මට්ටමක සිට වේගයෙන් ඉහළ යැමත් සමඟ, ඉදිරි මාස 3ක කාලය සඳහා වන උද්ධමන අපේක්ෂා, 2026 වසරේ අප්‍රේල් මාසයේ දී සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. කෙටි කාලීන උද්ධමන අපේක්ෂා ඉහළ යැම කෙරෙහි ගෝලීය බලශක්ති මිල ගණන්, සැපයුම් දාමයට එල්ල වන බාධා සහ අනෙකුත් පිරිවැය ඉහළ යෑමේ බලපෑම් ඇතුළු මැදපෙරදිග කලාපයේ භූ දේශපාලනික අවිනිශ්චිතතා ඉහළ යෑම ද හේතු වී ඇත. කෙසේ වුවද, උද්ධමන අපේක්ෂා මැදි කාලීනව ඉහළ යෑම සුළු මට්ටමක පැවති අතර, එම උද්ධමන අපේක්ෂා සමස්තයක් ලෙස 5% උද්ධමන ඉලක්කය වටා ස්ථායීව පාලනය වී පැවතුණි. උද්ධමනයේ මෑත කාලීන ඉහළ යෑම තාවකාලික තත්ත්වයක් ලෙස සහ මැදි කාලීනව උද්ධමනය ඉලක්කගත මට්ටම වෙත ළඟා වනු ඇතැයි සාමාන්‍යයක් ලෙස ආයතනික අංශය විශ්වාස කරන බව, කෙටි කාලීන අපේක්ෂා ස්වභාවයෙන් ම අනුවර්තනීය වුවද මැදි කාලීන අපේක්ෂා අඛණ්ඩව පාලනය වී පැවතීම මගින් පෙන්නුම් කෙරේ.

**රූප සටහන 06: උද්ධමන අපේක්ෂා - ආයතනික අංශය (%)**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**සටහන**

මාසිකව පවත්වනු ලබන උද්ධමන අපේක්ෂා පිළිබඳ සමීක්ෂණයේ අනුක්‍රමික වාරයන්හී දී වාර්තා වූ පරිදි ආයතනික අංශයේ උද්ධමන අපේක්ෂා මෙම රූප සටහන මගින් නිරූපණය වේ. එහි X අක්ෂය මගින් සමීක්ෂණ වාර (මාස) නිරූපණය වන අතර, එක් එක් රේඛාව මගින් ඉදිරි මාස 3ක්, වසරක්, වසර 2ක්, වසර 3ක් යන කාල පරාසයන් සඳහා වන අපේක්ෂිත උද්ධමනය පෙන්නුම් කරයි. ඉදිරි මාස 3ක් සහ වසරක් යන කාල පරාසයන් මගින් කෙටි කාලීන අපේක්ෂාවන් ද ඉදිරි වසර 2ක් සහ වසර 3ක් යන කාල පරාසයන් මගින් මැදි කාලීන අපේක්ෂාවන් ද නිරූපණය කෙරේ. එක් එක් රේඛාවල සිදුවන වෙනස්කම් මගින් කාලයත් සමඟ උද්ධමන අපේක්ෂා විකාශනය වන ආකාරය පෙන්නුම් කෙරේ.

**මූර්ත ආර්ථික වර්ධනය පිළිබඳ ඉදිරි දැක්ම**

ඉදිරි ආර්ථික දිශානතිය පෙන්වන දර්ශක, සමීක්ෂණ ප්‍රතිඵල සහ කාර්යමණ්ඩල ඇගැයීම් මත පදනම්ව, කර්මාන්ත සහ සේවා අංශවල කාර්යසාධනය පිළිබිඹු කරමින්, 2026 වසරේ දෙවන කාර්තුවේ දී මූර්ත ද.දේ.නියෙහි වර්ධනය ස්ථායීව පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ. මැදපෙරදිග කලාපයේ භූ දේශපාලනික අර්බුදකාරී තත්ත්ව හේතුවෙන් ඇතිවන ආර්ථික බලපෑම්වල තීව්‍ර බව පෙර අපේක්ෂා කළ මට්ටමට වඩා අඩු වීම හේතුවෙන් නුදුරු කාලීන වර්ධන අපේක්ෂා බොහෝ දුරට ධනාත්මකව පවතී. මේ අතර, දේශීය ඉල්ලුම වැඩිදියුණු වීම සහ අඛණ්ඩ සාර්ව ආර්ථික ස්ථායීතාව හේතුවෙන්, මැදි කාලීන වර්ධන මාවත එහි විභව නිමැවුම් මට්ටම දක්වා ක්‍රමයෙන් ශක්තිමත් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. කෙසේ වෙතත්, මෑතක දී ක්‍රියාත්මක කළ මුදල් ප්‍රතිපත්තිය දැඩි කිරීමේ බලපෑම ආර්ථිකය වෙත සම්ප්‍රේෂණය වීම යම්තාක් දුරකට පිළිබිඹු කරමින්, දේශීය ඉල්ලුම ඉහළ යෑම තරමක් ක්‍රමයෙන් සිදු වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

භූ දේශපාලනික ප්‍රවණතා, වෙනස් වන දේශීය හා විදේශීය තත්ත්ව මෙන්ම දේශගුණික අවදානම් මගින් ඇතිවිය හැකි බලපෑම් හේතුවෙන් මැදි කාලීන ආර්ථික ඉදිරි දැක්ම පිළිබඳ ඉහළ අවිනිශ්චිතතා පවතී. මැදපෙරදිග කලාපයේ යළිත් වර්ධනය වී ඇති භූ දේශපාලනික අර්බුද, ගෝලීය බලශක්ති වෙළඳපොළ, වෙළඳ ප්‍රවාහ, සැපයුම් දාම සහ ආයෝජක විශ්වාසය කෙරෙහි අහිතකර ලෙස බලපෑ හැකි අතර, එහි වක්‍ර බලපෑම් දේශීය ආර්ථික ක්‍රියාකාරකම් කෙරෙහි ද බලපෑ හැකිය. ගෝලීය වෙළඳ සහ ප්‍රතිපත්තිමය අවිනිශ්චිතතා මධ්‍යයේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන වෙළඳ හවුල්කරුවන්ගේ ප්‍රවණතා ද ඉදිරි කාලයේ දී ශ්‍රී ලංකාවේ වර්ධන ගමන්මග හැඩගස්වනු ඇත. මේ අතර, නිතර ඇති වන අයහපත් කාලගුණික බලපෑම් හේතුවෙන් මැදි කාලීන සිට දිගු කාලීන ආර්ථික වර්ධනය සීමා වීමට ඉඩ ඇති අතර, තිරසාර සහ දේශගුණික අවදානම්වලට ඔරොත්තු දෙන ආර්ථික වර්ධනයක් ප්‍රවර්ධනය සඳහා ප්‍රතිපත්තිමය අවශ්‍යතාව එමගින් අවධාරණය කෙරේ. මෙම පසුබිම තුළ, දැනට පවතින ආර්ථික වර්ධන ප්‍රවණතාව අඛණ්ඩව පවත්වා ගැනීම, ඉලක්කගත ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ සහ වර්ධනය ඉහළ නංවන උපායමාර්ග කාලෝචිත සහ ඵලදායී ලෙස ක්‍රියාවට නැංවීම මත රඳා පවතී.

**රූප සටහන 07: කාර්තුමය මූර්ත ද.දේ.නි.යේ වර්ධනයෙහි පුරෝකථන (වාර්ෂික ලක්ෂ්‍යමය)**
**2026 වසරේ ජූලි මස මුදල් ප්‍රතිපත්ති වාරයේ පුරෝකථන මත පදනම්ව**




ඉහත 02 රූප සටහනෙහි පැහැදිලි කිරීමේ සටහන බලන්න

මූලය: ශ්‍රී ලංකා මහ බැංකු කාර්යමණ්ඩල පුරෝකථන

## 2.2. පුරෝකථන සඳහා පාදක වන ප්‍රධාන උපකල්පන

2026 වසරේ ජූලි මස මුදල් ප්‍රතිපත්ති වාරයේ දී, මැදි කාලීන පුරෝකථනවලට එළැඹීම සඳහා භාවිත කරන ලද ප්‍රධාන උපකල්පනවල සාරාංශයක් මෙම කොටසේ දක්වා ඇත.

**ගෝලීය පරිසරය**

මැදපෙරදිග කලාපයේ පවතින භූ දේශපාලනික අර්බුදකාරී තත්ත්ව මධ්‍යයේ ගෝලීය ආර්ථික තත්ත්ව මත ඉහළ අවිනිශ්චිතතාවක් පවතී. Global Projection Model Network (GPMN)[7] අනුව, අපනයන අනුව බර තබන ලද විදේශ නිමැවුම් පරතරය[8] නුදුරු කාලීනව සෘණ අගයක පවතිනු ඇතැයි ද මැදි කාලීනව මධ්‍යස්ථ මට්ටම් කරා ක්‍රමයෙන් ඉහළ යනු ඇතැයි ද අපේක්ෂා කෙරේ. එක්සත් ජනපද මුදල් ප්‍රතිපත්තිය 2026 වසර පුරා නොවෙනස්ව පවතිනු ඇතැයි උපකල්පනය කර ඇත. උද්ධමනය ඉලක්කගත මට්ටමට වඩා ඉහළින් පැවතිය ද, 2027 වසර

---

[7] මහ බැංකුව මැදි කාලීන පුරෝකථන සිදු කිරීම සඳහා GPMN විසින් සකස් කරන ලද ගෝලීය සාර්ව ආර්ථික දර්ශකවල පුරෝකථන භාවිත කරයි. 2026 වසරේ ජූලි මස මුදල් ප්‍රතිපත්ති වාරයේ භාවිත කරන ලද පුරෝකථන 2026 වසරේ ජූනි 24 දින GPMN විසින් කරන ලද යාවත්කාලීන කිරීම් මත පදනම් වේ. මෙම යාවත්කාලීන කිරීමෙන් පසුව, මැදපෙරදිග කලාපයේ අර්බුදකාරී තත්ත්ව නැවත උද්ගත වීමත් සමඟ ගෝලීය බලශක්ති මිල ගණන් නිතර උච්චාවචනය වී ඇති අතර, එය නුදුරු කාලීන උද්ධමන පුරෝකථන සඳහා නිසි පරිදි ඇතුළත් කර ඇත. මීට අමතරව, මූලික පුරෝකථනය සඳහා පදනම් වන ගෝලීය උපකල්පනවල ශක්තිමත්භාවය තක්සේරු කිරීමේ දී, වෙනත් ජාත්‍යන්තර ආයතනවල පුරෝකථන ද මහ බැංකුව විසින් සැලකිල්ලට ගනු ලබයි.

[8] ශ්‍රී ලංකාවේ ප්‍රධාන වෙළඳ හවුල්කරුවන් හය දෙනෙකුට අනුරූප වන සමස්ත අපනයනයේ ප්‍රමතකරණය කරන ලද අනුපාත භාවිත කර GPMN පුරෝකථනයන්හි සපයා ඇති වෙළඳ හවුල්කරුවන්ගේ නිමැවුම් පරතරවල බරිත සාමාන්‍ය නිමැවුම් පරතරයක් ලෙස අපනයනය අනුව බර තබන ලද විදේශ නිමැවුම් පරතරය ගණනය කෙරේ.

දක්වා ම එක්සත් ජනපද මුදල් ප්‍රතිපත්ති පොලී අනුපාතිකය දැනට පවතින මට්ටමේ පවත්වාගෙන ගොස් ඉන්පසුව ක්‍රමයෙන් ලිහිල් කිරීමක් ආරම්භ කරනු ඇති බව GPMN පුරෝකථනය කරයි. 2026 වසරේ දී බ්‍රෙන්ට් බොරතෙල් සාමාන්‍ය මිල එක්සත් ජනපද ඩොලර් 80ක් සහ 2027 වසරේ දී එක්සත් ජනපද ඩොලර් 70ක් පමණ වනු ඇතැයි පුරෝකථනය කෙරේ. මේ අතර, ගෝලීය ආහාර මිල ගණන් වසර තුනක ඉහළ ම අගයට ආසන්නව පවතින නමුත් ගෝලීය සැපයුම් තත්ත්ව වැඩිදියුණු වීමේ අපේක්ෂා හේතුවෙන් මැදි කාලීනව ක්‍රමයෙන් අඩුවනු ඇතැයි පුරෝකථනය කෙරේ. ඉහත සඳහන් කරන ලද තොරතුරු නිකුත් කිරීමෙන් අනතුරුව, මැද පෙරදිග කලාපයේ අර්බුදකාරී තත්ත්ව යළිත් උද්ගත වූ අතර, එමගින් බලශක්ති සහ වෙළඳ භාණ්ඩ මිල ගණන්හි මෙන්ම සමස්ත විදේශීය අංශයේ ඉදිරි දැක්මෙහි ද අස්ථාවරත්වයක් ඇති විය. කෙසේ වෙතත්, මෙම නවතම ප්‍රවණතා, මැදි කාලීන පුරෝකථන සැකසීමේ දී භාවිත කරනු ලබන නුදුරු කාලීන පුරෝකථන සැකසීමේ දී සැලකිල්ලට ගෙන ඇත.

**රූප සටහන 08: ගෝලීය පුරෝකථන (කාර්තුමය)**




*සටහන: සැලකිල්ලට ගන්නා රටවල් බහුතරයක දත්ත සියල්ල ලැබෙන තෙක් නවතම GPMN පුරෝකථනවල වඩාත් මෑත කාලීන දත්ත වාර්තා වූ කාලපරිච්ඡේදය ලෙස 2026 වසරේ පළමු කාර්තුව සැලකේ.*

2026 වසරේ ජනවාරි මස මුදල් ප්‍රතිපත්ති වාරය (2026 වසරේ පෙබරවාරි මුදල් ප්‍රතිපත්ති වාර්තාව)

2026 වසරේ ජූලි මස මුදල් ප්‍රතිපත්ති වාරය (2026 වසරේ අගෝස්තු මුදල් ප්‍රතිපත්ති වාර්තාව)

මූලයන්: කාර්තුමය පුරෝකථන ආකෘතිය, Global Projection Model Network (GPMN) (2026/01/20 සහ 2026/06/24 යාවත්කාලීන කිරීම)

**රාජ්‍ය මූල්‍ය අංශයේ ගමන් මග**

වත්මන් පුරෝකථන සඳහා ඇතුළත් කර ඇති රාජ්‍ය මූල්‍ය අංශයේ ගමන්මග හා සම්බන්ධ උපකල්පන, 2026 වසරේ ජූනි මාසයේ දී මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් ප්‍රකාශයට පත් කරන ලද 2027 වසර සඳහා වන රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශනයෙන් ගත් තොරතුරු අනුව යාවත්කාලීන කර ඇත.

**විදේශීය ජංගම ගිණුම**

පසුගිය වසර තුන තුළ වාර්තා වූ ජංගම ගිණුමේ අතිරික්තයන්ට සාපේක්ෂව, 2026 වසර සඳහා ජංගම ගිණුමේ තරමක හිඟයක් ඇස්තමේන්තු කර ඇති අතර, එය ප්‍රධාන වශයෙන් ඉන්ධන සහ වාහන ආනයන ඉහළ යෑම හේතුවෙන් වෙළඳ හිඟය පුළුල් වීම මෙන්ම, හිතකර විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ලැබීම් පැවතිය ද සංචාරක ඉපැයීම් පහළ යෑම හේතුවෙන් සේවා ගිණුමේ අතිරික්තය අඩු වීම පිළිබිඹු කරයි.

### 2.3 වාර්තා වන සැබෑ දත්ත මූලික පුරෝකථනවලින් අපගමනය වීමට ඇති අවදානම්

මෙම වාර්තාවේ ඉදිරිපත් කර ඇති මූලික පුරෝකථනවලට වඩා වාර්තා විය හැකි සැබෑ උද්ධමනය සහ දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය ඉහළ යෑම සඳහා මෙන්ම පහළ යෑම සඳහා අවදානම් පවතී. 2026 වසරේ ජූලි මස මුදල් ප්‍රතිපත්ති වාරයට අදාළව, එවැනි අවදානම් පිළිබඳ පැහැදිලි කිරීමක් මෙම කොටසෙහි දක්වා ඇත. මෙම කොටසෙහි සඳහන් කර ඇති අවදානම් එකක් හෝ කිහිපයක් සාක්ෂාත් වීම වාර්තා වන උද්ධමනය සහ/හෝ දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය පුරෝකථනය කළ මූලික ගමන් මග අපගමනය වීමට හේතු විය හැකිය. ඉහළ යෑමේ සහ පහළ යෑමේ අවදානම් දෙඅංශය ම සාක්ෂාත් වීමක දී වාර්තා වන සැබෑ උද්ධමනයේ හෝ දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධන දිශානතිය එම අවදානම්වල සාපේක්ෂ ප්‍රබලතාවය මත රඳා පවතිනු ඇත.

**වාර්තා වන සැබෑ උද්ධමනය මූලික පුරෝකථනවලින් අපගමනය වීමට ඇති අවදානම්**

උද්ධමනය පුරෝකථනය කළ මට්ටමට වඩා ඉහළ යෑම සඳහා අවදානම් කිහිපයක් හේතු විය හැකිය. මෙම අවදානම් අතර භූ දේශපාලනික අර්බුදකාරී තත්ත්ව උග්‍ර වීමට ඇති හැකියාව හේතුවෙන් ගෝලීය වෙළඳ භාණ්ඩ වෙළඳපොළ, බලශක්ති සැපයුම් සහ නැව් මාර්ග කෙරෙහි බාධා ඇති වීම තුළින් දේශීය බලශක්ති සහ ප්‍රවාහන වියදම් මෙන්ම පොහොර මිල ගණන් ඉහළ යෑම සිදුවිය හැක. තවද, අහිතකර වෙළඳපොළ අපේක්ෂා සහ බාහිර කම්පන හේතු කොට ගෙන ශ්‍රී ලංකා රුපියල ඉහළ මට්ටම්වලින් අවප්‍රමාණය වීමට ඇති හැකියාව හේතුවෙන් ආනයනික භාණ්ඩ සහ නිෂ්පාදන යෙදවුම්වල දේශීය මිල ගණන් ඉහළ යා හැකි අතර, එමගින් උද්ධමනය මත වන පීඩනය ඉහළ යෑමට ඉඩ ඇත. මීට අමතරව, එල් නිනෝ තත්ත්ව ඇති වීම ඇතුළු අහිතකර කාලගුණික තත්ත්ව ඇතිවීමේ හැකියාව මගින්

කෘෂිකාර්මික නිෂ්පාදනයට සහ ජලවිදුලි උත්පාදනයට බාධා ඇති විය හැකි අතර, එමගින් ආහාර හා බලශක්ති උද්ධමනය මත ඉහළ පීඩන ඇතිවිය හැකිය.

මේ අතර, භූ දේශපාලනික අර්බුදකාරී තත්ත්ව ලිහිල් වන අවස්ථාවක දී ගෝලීය බලශක්ති මිල ගණන් අපේක්ෂා කළ මට්ටමට වඩා අඩු වීමේ හැකියාව හේතුවෙන් වාර්තා වන උද්ධමනය, උද්ධමන පුරෝකථනවලට වඩා පහළ යා හැකිය. එවැනි ප්‍රවණතා හේතුවෙන් දේශීය බලශක්ති සහ ප්‍රවාහන වියදම් පහළ යා හැකි අතර, එහි ප්‍රතිඵලයක් ලෙස උද්ධමන ගමන්මග, පුරෝකථනය කර ඇති මට්ටමට වඩා අඩු වීමට ඉඩ ඇත.

වත්මන් මුදල් ප්‍රතිපත්ති වාරයේ විනිශ්චයන්ට අනුව, උද්ධමන පුරෝකථන සඳහා ඇති අවදානම් නුදුරු කාලීනව මෙන්ම මැදි කාලීනව උද්ධමනය ඉහළ යෑමේ අවකාශය වෙත වඩාත් නැඹුරු වී ඇතැයි තක්සේරු කර ඇත.

**වාර්තා වන සැබෑ ආර්ථික වර්ධනය මූලික පුරෝකථනවලින් අපගමනය වීමට ඇති අවදානම්**

ආර්ථික වර්ධනය නුදුරු කාලීනව මෙන්ම මැදි කාලීනව පුරෝකථනය කළ මට්ටමට වඩා පහළ යෑම සඳහා සාධක කිහිපයක් හේතු විය හැකිය. මැදපෙරදිග කලාපයේ භූ දේශපාලනික අර්බුදකාරී තත්ත්ව තවදුරටත් උග්‍ර වීම සහ ගෝලීය වෙළඳ මෙන්ම ප්‍රතිපත්තිමය අවිනිශ්චිතතා ඉහළ යෑම හේතුවෙන් ශ්‍රී ලංකාවේ ප්‍රධාන වෙළඳ හවුල්කරුවන්ගේ ආර්ථික ක්‍රියාකාරකම් දුර්වල විය හැකි අතර එමගින් ශ්‍රී ලංකා අපනයන සඳහා පවතින විදේශීය ඉල්ලුම අඩු වී අපනයන කේන්ද්‍ර කරගත් කර්මාන්තවලට අහිතකර බලපෑම් එල්ල විය හැකිය. එමෙන්ම, ප්‍රධාන සංචාරක මූලාශ්‍ර වෙළඳපොළවල පවතින දුර්වල ආර්ථික තත්ත්ව හේතුවෙන් සංචාරක පැමිණීම් සහ සංචාරක කර්මාන්තය ආශ්‍රිත වියදම් අඩු වීමට ඉඩ ඇති අතර, එය නවාතැන්, ආහාර සේවා, ප්‍රවාහන සහ සංචාරක කර්මාන්තය ආශ්‍රිත අනෙකුත් ක්‍රියාකාරකම් කෙරෙහි බලපෑම් ඇති කරනු ඇත. එල් නිනෝ තත්ත්ව ඇතිවීමේ හැකියාව හේතුවෙන් දිගු කාලීන වියළි කාලගුණික තත්ත්ව සහ අක්‍රමවත් වර්ෂාපතන රටා ඇතුළු අයහපත් කාලගුණ තත්ත්ව ඇති විය හැකි අතර, එමගින් කෘෂිකාර්මික නිෂ්පාදන සහ ඒ ආශ්‍රිත ආර්ථික ක්‍රියාකාරකම්වලට අහිතකර ලෙස බලපෑම් එල්ල විය හැකිය. මීට අමතරව, ජලාශවල ජල මට්ටම පහළ යෑම හේතුවෙන් ජල විදුලි උත්පාදනය සීමා වී වැඩි පිරිවැයක් සහිත තාප විදුලි උත්පාදනය මත රඳා පැවතීමට සිදු විය හැකි අතර, එමගින් බලශක්ති සහ නිෂ්පාදන වියදම් ඉහළ යෑමට ඉඩ ඇත. සමස්තයක් ලෙස ගත් කළ, මෙම ප්‍රවණතා කෘෂිකාර්මික, කර්මාන්ත සහ සේවා යන අංශයන්වල ආර්ථික ක්‍රියාකාරකම් කෙරෙහි බලපෑම් කළ හැකි අතර, එහි ප්‍රතිඵලයක් ලෙස වර්ධන ගමන් මග පුරෝකථනය කර ඇති මට්ටමට වඩා අඩු විය හැකිය.

ආර්ථික වර්ධනය පුරෝකථනය කර ඇති මට්ටමට වඩා ඉහළ යෑමට ඇති හැකියාව සැලකූ විට, පෞද්ගලික අංශයේ ණය වර්ධනය අඛණ්ඩව ඉහළ යෑම මගින් පරිභෝජන සහ ආයෝජන වැඩිදියුණු වීම හරහා ආර්ථික ක්‍රියාකාරකම් අපේක්ෂා කළ මට්ටමට වඩා ශක්තිමත් වීමට සහාය විය හැකිය. දේශීය

ඉල්ලුම ශක්තිමත් වීම මගින් ද වෙළඳ, ප්‍රවාහන සහ අනෙකුත් සේවා ආශ්‍රිත ක්‍රියාකාරකම් වෙත ධනාත්මක වක්‍ර බලපෑම් ඇති කළ හැකි අතර, එය දැනට පුරෝකථනය කර ඇති මට්ටමට වඩා ඉහළ වර්ධනයකට සහාය වනු ඇත.

## 2.4. පෙර පුරෝකථන සමඟ සැසඳීම

මෙම කොටස මගින් 2026 වසරේ පෙබරවාරි මුදල් ප්‍රතිපත්ති වාර්තාවේ ඉදිරිපත් කරන ලද, 2026 වසරේ ජනවාරි මස මුදල් ප්‍රතිපත්ති වාරයේ දී පැවති පුරෝකථනයට සාපේක්ෂව වත්මන් පුරෝකථන සංසන්දනය කෙරේ. 2026 වසරේ පෙබරවාරි මුදල් ප්‍රතිපත්ති වාර්තාවේ ඉදිරිපත් කරන ලද පුරෝකථන, මැදපෙරදිග භූ දේශපාලනික අර්බුදය තීව්‍ර වීමට පෙර සකස් කරන ලද ඒවා වේ. එසේ වුවද, වත්මන් පුරෝකථන සැකසීමේ දී මෙම ප්‍රවණතාවන් සැලකිල්ලට ගෙන ඇත. ඒ අනුව, මූලික පුරෝකථන සඳහා පාදක වී ඇති ප්‍රධාන උපකල්පන කිහිපයක් සංශෝධනය කර ඇත.

**මැදි කාලීන පුරෝකථන සඳහා භාවිත කළ ප්‍රධාන උපකල්පන**

2026 වසරේ පෙබරවාරි මුදල් ප්‍රතිපත්ති වාර්තාවේ ඇතුළත් වූ 2026 වසරේ ජනවාරි මස මුදල් ප්‍රතිපත්ති වාරයේ දී භාවිත කරන ලද ගෝලීය පුරෝකථන සමඟ සසඳන විට, 2026 වසරේ ජූලි මස මුදල් ප්‍රතිපත්ති වාරයේ දී භාවිත කරන ලද ගෝලීය පුරෝකථනවලට අනුව, ශ්‍රී ලංකාවේ ප්‍රධාන වෙළඳ හවුල්කරුවන්ගේ අපනයන අනුව බර තබන ලද විදේශ නිමැවුම් පරතරය පිළිබඳ ඉදිරි දැක්ම දුර්වල වී ඇත. මැදපෙරදිග කලාපයේ භූ දේශපාලනික අර්බුදයන්හි වක්‍ර බලපෑම් හේතුවෙන් යුරෝ කලාපයේ, එක්සත් රාජධානියේ සහ එක්සත් ජනපදයේ ආර්ථික වර්ධන අපේක්ෂා දුර්වල වීම මෙම වෙනස්වීම මගින් පෙන්නුම් කරයි. 2026 වසරේ ජනවාරි මස මුදල් ප්‍රතිපත්ති වාරයේ පුරෝකථන හා සසඳන විට ගෝලීය ආහාර උද්ධමනය 2027 වසරේ මුල් කාලය දක්වා ඉහළ ගොස්, ඉන් අනතුරුව පහළ යනු ඇතැයි පුරෝකථනය කෙරේ. මේ අතර, මැදපෙරදිග අර්බුදය තීව්‍ර වීම, ප්‍රධාන නැව් මාර්ග වෙත බාධා එල්ල වීම සහ ඒ ආශ්‍රිත අවිනිශ්චිතතා ඉහළ යැම හේතුවෙන් ගෝලීය තෙල් මිල ගණන් පිළිබඳ ඉදිරි දැක්ම, විශේෂයෙන් නුදුරු කාලීනව සැලකිය යුතු ලෙස ඉහළ ගොස් ඇත. 2026 වසරේ ජනවාරි මස පුරෝකථන සමඟ සසඳන විට අපේක්ෂිත එක්සත් ජනපදයේ මුදල් ප්‍රතිපත්ති ලිහිල් කිරීමේ වේගය ද මන්දගාමී වී ඇත.

දේශීය ප්‍රවණතා සැලකූ විට, 2026 වසරේ ජනවාරි මස මුදල් ප්‍රතිපත්ති වාරයේ දී සිදු කරන ලද පුරෝකථන 2026 වසරේ පරිපූරක අයවැය ඇස්තමේන්තුව මත පදනම් වූ නමුත් වත්මන් පුරෝකථනවල රාජ්‍ය මූල්‍ය ගමන්මග 2027 වසරේ රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශයේ තොරතුරු මත පදනම්ව යාවත්කාලීන කර ඇත. රාජ්‍ය මූල්‍ය ආදායම ඉහළ යැම හේතුවෙන්, 2026 වසර සඳහා අඩු අයවැය හිඟයක් වත්මන් පුරෝකථනවලට ඇතුළත් වේ.

**උද්ධමනයේ හැසිරීම**

2026 වසරේ පෙබරවාරි මුදල් ප්‍රතිපත්ති වාර්තාවේ ප්‍රකාශයට පත් කරන ලද පුරෝකථන හා සැසඳීමේ දී 2026 වසරේ පළමු කාර්තුවේ වාර්තා වූ වාර්ෂික ලක්ෂ්‍යාමය මතුපිට උද්ධමනය සමස්තයක් ලෙස පුරෝකථනය කළ මට්ටම ආසන්නයේ පැවතුණි. කෙසේ වෙතත්, 2026 වසරේ දෙවන කාර්තුවේ දී වාර්තා වූ උද්ධමනය පෙර පුරෝකථනයට වඩා ඉහළ අගයක් ගත් අතර, මැදපෙරදිග කලාපයේ පවතින අර්බුදකාරී තත්ත්වය හේතුවෙන් බලශක්ති මිල ගණන් ඉහළ යෑම එයට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත. මතුපිට උද්ධමනය පිළිබඳ නවතම පුරෝකථන ද මීට පෙර නිකුත් කරන ලද මුදල් ප්‍රතිපත්ති වාර්තාවේ සඳහන් වූ උද්ධමන ගමන් මගට වඩා ඉහළ මට්ටමක පවතින අතර, විශේෂයෙන් 2026 වසරේ ඉදිරි කාලය තුළ සහ 2027 වසරේ මුල් භාගය දක්වා එම තත්ත්වය දක්නට ලැබෙනු ඇත. මේ සඳහා ඉහළ බලශක්ති මිල ගණන් මෙන්ම ඉහළ ආහාර මිල ගණන් ප්‍රධාන වශයෙන් බලපානු ඇත. නුදුරු කාලයේ දී උද්ධමනය ඉහළ යෑමෙන් පසුව, මැදපෙරදිග කලාපයේ අර්බුදකාරී තත්ත්ව ක්‍රමයෙන් පහළ යනු ඇතැයි යන උපකල්පනය යටතේ බලශක්ති මිල ගණන් ඉහළ යෑමේ බලපෑම් ක්‍රමයෙන් පහව යෑමත් සමඟ, උද්ධමනය පහළ යනු ඇති අපේක්ෂා කෙරේ. මීට පෙර සිදු කරන ලද පුරෝකථනයට අනුකූලව, මතුපිට උද්ධමනය මැදි කාලීනව උද්ධමන ඉලක්කය වෙත ළඟා වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

# 3. වර්තමාන ආර්ථික තත්ත්වය

## 3.1. උද්ධමනය

***වසරේ මුල් මාසවල පහළ මට්ටමක පැවති මතුපිට උද්ධමනය, පසුව ඉහළ ගොස් අප්‍රේල් මාසයේ දී 5%ක ඉලක්කගත මට්ටම අභිබවා ගිය අතර ඒ සඳහා මැදපෙරදිග යුද තත්ත්වයේ බලපෑමෙන් ඉහළ ගිය ගෝලීය තෙල් මිල දේශීය බලශක්ති මිල ගණන් වෙත සම්ප්‍රේෂණය වීම හේතු විය.***

**රූප සටහන 09: මතුපිට සහ මූලික උද්ධමනයේ හැසිරීම (කො.පා.මි.ද., 2021=100)**




මූලය: ජනලේඛන සහ සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කො.පා.මි.ද., 2021=100) පදනම් කරගත් වාර්ෂික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය, 2026 වසරේ ජනවාරි මාසයේ දී 2.3%ක් ලෙස වාර්තා වූ අතර ආහාර උද්ධමනය පහළ යෑම හේතුවෙන් 2026 වසරේ පෙබරවාරි මාසයේ දී 1.6%ක් දක්වා අඩු විය. ඉන් අනතුරුව, ආහාර නොවන උද්ධමනය ඉහළ යෑම සහ සංඛ්‍යානමය පදනම් බලපෑම හේතුවෙන් 2026 වසරේ මාර්තු මාසයේ දී මතුපිට උද්ධමනය 2.2% දක්වා ඉහළ ගියේය. කෙසේ වෙතත්, 2026 වසරේ අප්‍රේල් මාසයේ දී කො.පා.මි.ද.පදනම් කරගත් මතුපිට උද්ධමනය 5% උද්ධමන ඉලක්කය ඉක්මවා යමින් 5.4% ක් දක්වා වේගයෙන් ඉහළ ගියේය. 2026 වසරේ පෙබරවාරි මස අග සිට මැදපෙරදිග යුද්මය වාතාවරණය තීව්‍ර වීම හේතුවෙන් ඇති වූ බාහිර වක්‍ර බලපෑම් මෙම ඉහළ යෑමේ ප්‍රවණතාවට බෙහෙවින් හේතු විය. එම තත්ත්වය හෝමුස් සමුද්‍ර සන්ධිය හරහා සිදු කෙරුණු ගෝලීය තෙල් සැපයුම සහ නැව්ගත කිරීම් සඳහා බාධා ඇති කළ අතර එමගින් ගෝලීය තෙල් මිල ඉහළ ගියේය. එහි ප්‍රතිඵලයක් ලෙස දේශීය ඉන්ධන සහ එල්.පී. ගෑස් මිල ඉහළ දමමින් සංශෝධනය කිරීමට සිදු විය. ඉන් පසු මාසවල දී මතුපිට උද්ධමනය ඉහළ මට්ටමක පැවති අතර, අඛණ්ඩව සිදු වූ දේශීය බලශක්ති මිල සංශෝධනවල බලපෑම මෙන්ම ආහාර සැපයුම් දාමයන් කෙරෙහි ඇති වූ දෙවන අදියරේ බලපෑම් පිළිබිඹු කරමින් 2026 වසරේ ජූනි මාසයේ දී 6.8%ක් දක්වා තවදුරටත් ඉහළ ගියේය.[9] අදාළ කාල පරිච්ඡේදය තුළ, කො.පා.මි.ද. පදනම් කරගත් වාර්ෂික ලක්ෂ්‍යමය ආහාර උද්ධමනය 2026 වසරේ ජනවාරි මස 3.3%ක සිට 2026 වසරේ පෙබරවාරි මස වන

[9] ආහාර නොවන කාණ්ඩයේ නිවාස කුලී ගැලපීම සහ ආහාර උද්ධමනයේ පදනම් බලපෑම හේතුවෙන් කො.පා.මි.ද. මත පදනම් වූ මතුපිට උද්ධමනය 2026 වසරේ ජූනි මස 6.8%ක සිට 2026 වසරේ ජූලි මාසයේ 7.3%ක් දක්වා ඉහළ ගියේය.

විට 0.2%ක් දක්වා පහළ ගිය අතර, එය මෑතකාලීන මාසවල වාර්තා වූ අවම අගය විය. ඉන් අනතුරුව, වරින් වර ඇතිවූ උච්චාවචනයන් මධ්‍යයේ වුව ද, ආහාර උද්ධමනය සමස්තයක් ලෙස ඉහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කරමින්, 2026 වසරේ ජූනි මාසය වන විට 3.6%ක් දක්වා ඉහළ ගියේය. දේශීය ඉන්ධන, එල්පී ගෑස් සහ විදුලි ගාස්තු ඉහළ දමමින් සිදු කළ සංශෝධනවල ඍජු සහ වක්‍ර බලපෑම් පිළිබිඹු කරමින් එම කාල සීමාව තුළ වාර්ෂික ලක්ෂ්‍යමය ආහාර නොවන උද්ධමනය 2026 වසරේ ජනවාරි මස වාර්තා වූ 1.8%ක සිට 2026 වසරේ ජූනි මස වන විට 8.4%ක් දක්වා සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. මේ අතර, ජාතික පාරිභෝගික මිල දර්ශකය (ජා.පා.මි.ද., 2021=100) පදනම් කරගත් වාර්ෂික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය 2026 වසරේ පළමු භාගයේ දී ඒ හා සමානව ඉහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කරමින්, 2026 වසරේ ජනවාරි මස වාර්තා වූ 2.4%ට සාපේක්ෂව 2026 වසරේ ජූනි මාසයේ දී 6.5%ක් දක්වා ඉහළ ගියේය.

**රූප සටහන 10: වාර්ෂික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය සඳහා දායකත්වය (කො.පා.මි.ද., 2021=100)**




*සටහන: 2018 වසරේ අරමුණ අනුව ඒකපුද්ගල පරිභෝජනය වර්ගීකරණය (Classification of Individual Consumption According to Purpose 2018) භාවිත කරමින් සමස්ත (මතුපිට) පාරිභෝගික මිල දර්ශකයේ භාණ්ඩ හා සේවා පැසවලින් (2021=100) සේවා සම්බන්ධ සංරචක උකහා ගෙන ඇත.*

මූලයන්: ජනලේඛන සහ සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකු කාර්යමණ්ඩල ගණනය කිරීම්

දිට්වා සුළිකුණාටුවෙන් පසු ඇති වූ ආහාර සැපයුම් බාධා සහ නිවාස කුලී ඉහළ යෑම හේතුවෙන් ආහාර නොවන මිල ගණන් ඉහළ යෑම පිළිබිඹු කරමින් කො.පා.මි.ද. පදනම් කරගත් මාසික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය, 2026 වසරේ ජනවාරි මාසයේ දී 0.6%කින් ඉහළ ගියේය. කෙසේ වෙතත්, ප්‍රධාන වශයෙන් දිට්වා සුළි කුණාටුව හේතුවෙන් ආහාර සැපයුමට එල්ල වූ බාධා සාමාන්‍ය තත්ත්වයට පත් වීම සහ මහ කන්නයේ අස්වැන්න ලැබීමත් සමඟ, 2026 වසරේ පෙබරවාරි මාසයේ දී, මාසික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය ඍණ අගයක් වාර්තා කළේය. අස්වැන්න ලැබීමත් සමඟ ආහාර මිල ගණන් පහළ ගිය ද, ආහාර නොවන කාණ්ඩයේ විශේෂයෙන් ම ඉන්ධන සහ එල්.පී. ගෑස්වල දේශීය මිල ගණන් ඉහළ යෑම හේතුවෙන් 2026 වසරේ මාර්තු මාසයේ මාසික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය 0.3%කින් ඉහළ ගියේය.

**රූප සටහන 11: ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ දේශීය ඛනිජ තෙල් මිල සංශෝධන**




මූලය: ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

**රූප සටහන 12: වාර්ෂික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය සඳහා උපකාණ්ඩ අනුව දායකත්වය (කො.පා.මි.ද., ප්‍රතිශතාංක)**




*සටහන: කො.පා.මි.ද. දර්ශකයේ උපකාණ්ඩවල බර තැබීම් වරහන් තුළ දක්වා ඇත. 2026 වසරේ පෙබරවාරි මස මුදල් ප්‍රතිපත්ති වාර්තාව ප්‍රකාශයට පත් කිරීමෙන් පසු වර්ධනයන් පිළිබිඹු කිරීම සඳහා, 2026 වසරේ ජූනි සඳහා ලබා ගත හැකි නවතම දත්ත 2025 වසරේ දෙසැම්බර් මාසයේ දී වාර්තා වූ දත්ත සමඟ සංසන්දනය කර ඇත.*

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

2026 වසරේ අප්‍රේල් මස මුල් භාගයේ දී ක්‍රියාත්මක කරන ලද විදුලි ගාස්තු ඉහළ නැංවීම, ඉන්ධන සහ එල්.පී. ගෑස් සම්බන්ධයෙන් අඛණ්ඩව සිදු වූ දේශීය මිල සංශෝධන මෙන්ම ආහාර මිල ගණන් ඉහළ යෑම හේතුවෙන්, අප්‍රේල් මාසයේ මාසික මතුපිට උද්ධමනය මෑතකාලීන ඉහළම මට්ටම වන 3.0% දක්වා ඉහළ ගියේය. ඉන් අනතුරුව, ආහාර

සහ ආහාර නොවන යන කාණ්ඩ දෙකෙහි ම දායකත්වයෙන් මාසික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය 2026 වසරේ ජූනි මාසය දක්වා ධන අගයන්හි පැවතුණි. 2026 වසරේ ජූනි මාසයේ මාසික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය 2.1%කින් ඉහළ යෑමට ආහාර මිල ගණන්, විශේෂයෙන් ම නැවුම් මත්ස්‍ය සහ එළවළු මිල ගණන් තියුණු ලෙස ඉහළ යෑම ප්‍රධාන වශයෙන් හේතු විය.

**රූප සටහන 13: මාසික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය සඳහා දායකත්වය (කො.පා.මි.ද., 2021=100)**




මූලයන්: ජනලේඛන සහ සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකු කාර්යමණ්ඩල ගණනය කිරීම්

**රූප සටහන 14: මතුපිට උද්ධමනය (කො.පා.මි.ද., වාර්ෂික ලක්ෂ්‍යමය, %) විවිධ වර්ණ රූප සටහන**




*සටහන: 2023 ජනවාරි මාසයට පෙර දත්ත කො.පා.මි.ද.(2013=100) මත පදනම් වන අතර, 2023 ජනවාරි මාසයේ සිට ආරම්භ වන දත්ත කො.පා.මි.ද.(2021=100) මත පදනම් වේ. කො.පා.මි.ද.(2021=100) මත පදනම්ව, මූලික බර තැබීම් වරහන් තුළ සඳහන් කර ඇත. සාපේක්ෂව කාණ්ඩයක මූලික බර තැබීම (සියලු අයිතමයන් අවස්ථාවේ දී හැර) උස මගින් නිරූපණය වේ.*

මූලය: ජනලේඛන සහ සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

ආර්ථිකයේ යටිදැරි උද්ධමන ප්‍රවණතා පිළිබිඹු කරන කො.පා.මි.ද. කරගත් වාර්ෂික ලක්ෂ්‍යමය මූලික උද්ධමනය, 2026 වසරේ පෙබරවාරි මාසයේ දී සිදු වූ සුළු පහළ යෑම හැරුණු කොට, 2026 වසරේ පළමු භාගය තුළ ක්‍රමයෙන් ඉහළ ගොස්, 2026 වසරේ ජූනි මාසය වන විට 4.0% දක්වා ළඟා විය. 2026 වසරේ අප්‍රේල් මාසයේ සිට දක්නට ලැබුණු මතුපිට උද්ධමනයේ තියුණු ඉහළ යෑම, මූලික උද්ධමනය තුළින් සම්පූර්ණයෙන් ම පිළිබිඹු නොවූයේ, මූලික උද්ධමන ගණනයේදී බැහැර කර ඇති බලශක්ති සහ නිතර මිල උච්චාවචනය වන ආහාර ආශ්‍රිත මිල ඉහළ යෑම මතුපිට උද්ධමනය වැඩි වීමට ප්‍රධාන වශයෙන් හේතු වීමයි. කෙසේ වෙතත්, දේශීය බලශක්ති මිල ගණන් ඉහළ දමමින් කරන සංශෝධනවල ඇතැම් වක්‍ර බලපෑම් මූලික උද්ධමනය කෙරෙහි බලපෑවේය. ඒ හා සමානව, ජා.පා.මි.ද. පදනම් කරගත් වාර්ෂික ලක්ෂ්‍යමය මූලික උද්ධමනය ද 2026 වසරේ පළමු භාගයේ දී ඉහළ යෑමේ ප්‍රවණතාව අඛණ්ඩව පවත්වා ගත් අතර, එය 2026 වසරේ ජනවාරි මස පැවති 2.2%ක අගයේ සිට 2026 වසරේ ජූනි මාසය වනවිට 5.0%ක් දක්වා ඉහළ ගියේය.

***පවතින නවතම වැටුප් දර්ශකවලින් පෙන්නුම් කෙරෙන්නේ, 2026 වසරේ මාර්තු මාසයේ සිට උද්ධමනය ඉහළ යෑමත් සමඟ රාජ්‍ය සහ පෞද්ගලික යන අංශ දෙකෙහි ම මූර්ත වැටුප් වර්ධනය මන්දගාමී වූ බවයි.***

අවිධිමත් පෞද්ගලික අංශයේ වැටුප් ප්‍රමාණ දර්ශකයෙහි (2018=100) වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය, 2026 වසරේ ජනවාරි මාසයේ පැවති 3.0% සිට 2026 වසරේ අප්‍රේල් මාසයේ දී 1.0%ක් දක්වා ක්‍රමයෙන් පහළ ගිය අතර, අනතුරුව 2026 වසරේ මැයි මාසයේ දී නැවත එය 2.8%ක් දක්වා ඉහළ ගියේය. කෙසේ වෙතත්, උද්ධමනය ඉහළ යෑම හේතුවෙන් මිලදී ගැනීමේ හැකියාවට අඛණ්ඩව බලපෑම් එල්ල වූ බැවින්, වසර ආරම්භයේ දී පැවති මට්ටම හා සසඳන විට මූර්ත වැටුප් වර්ධනය මධ්‍යස්ථ මට්ටමක පැවතුණි.

රාජ්‍ය අංශයේ වැටුප් ප්‍රමාණ දර්ශකය ගත් කළ, වාර්ෂික ලක්ෂ්‍යමය මූර්ත වැටුප් වර්ධනය 2026 වසරේ ජනවාරි මාසයේ පැවති 7.2%හි සිට මාර්තු මාසයේ දී 7.3%ක් දක්වා සුළු වශයෙන් ඉහළ ගිය නමුත්, අප්‍රේල් මාසයේ දී එය 0.2% දක්වා තියුණු ලෙස පහත වැටුණි. මිලදී ගැනීමේ හැකියාවේ අඩුවීමක් පෙන්නුම් කරමින් ඉන් අනතුරුව මූර්ත වැටුප් වර්ධනය ඍණ අගයක් ගත් අතර මැයි මාසයේ දී 0.4%ක පහළ යෑමක් වාර්තා විය.

සේවක අර්ථසාධක අරමුදල (EPF) පදනම් කරගත් විධිමත් පෞද්ගලික අංශයේ වැටුප් ප්‍රමාණ දර්ශකය, දත්ත ඇති කාලසීමාව තුළ සාපේක්ෂව ශක්තිමත් මූර්ත වැටුප් වර්ධනයක් පෙන්නුම් කළේය. මෑත මාසවලට අදාළ විද්‍යුත් දායකත්ව වාර්තා (e-contribution records) පමණක් ආවරණය වන තාවකාලික සේවක අර්ථසාධක අරමුදලේ දායකත්ව දත්ත (provisional EPF contribution data) මත පදනම්ව බලන කල, වාර්ෂික ලක්ෂ්‍යමය මූර්ත වැටුප් වර්ධන වේගය 2026 වසරේ ජනවාරි මාසයේ පැවති 8.9%හි සිට මාර්තු මාසයේ දී 7.7% දක්වා පහළ ගියේය.

**රූප සටහන 15: අවිධිමත් පෞද්ගලික අංශයේ වැටුප් ප්‍රමාණ දර්ශකයේ (2018=100), රාජ්‍ය අංශයේ වැටුප් ප්‍රමාණ දර්ශකයේ (2016=100) සහ සේවක අර්ථසාධක අරමුදල පදනම් කරගත් විධිමත් අංශයේ වැටුප් ප්‍රමාණ දර්ශකයේ (2017 ජන.=100) වෙනස්වීම**




*2026 වසරේ ජනවාරි මස සිට මාර්තු දක්වා දර්ශක අගයන් තාවකාලික වේ.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## 3.2. මූර්ත අංශය

***2025 වසරේ දක්නට ලැබුණු ධනාත්මක වර්ධන ප්‍රවණතාව අඛණ්ඩව පවත්වා ගනිමින්, 2026 වසරේ පළමු කාර්තුවේ දී ශ්‍රී ලංකා ආර්ථිකය තවදුරටත් ප්‍රසාරණය විය.***

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තුවලට අනුව, 2026 වසරේ පළමුවන කාර්තුවේ දී ආර්ථිකය 5.1%කින් (වාර්ෂික ලක්ෂ්‍යමය) වර්ධනය වූ අතර, එය 2025 වසරේ අනුරූප කාර්තුව තුළ වාර්තා වූ 4.7%ක වර්ධනයට වඩා ඉහළ අගයකි. මෙම ප්‍රසාරණයට ප්‍රධාන ආර්ථික අංශ තුනෙහි ධනාත්මක දායකත්වය හේතු විය. කෘෂිකාර්මික කටයුතුවල වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් ම තෙල් සහිත පළතුරු බෝග වගාව (පොල්, තැඹිලි සහ කටු පොල්), වන වගාව සහ වනාන්තර ආශ්‍රිත කටයුතු සහ එළවළු වගාව හේතු විය. කර්මාන්ත අංශයේ ප්‍රසාරණය සඳහා ඉදිකිරීම්, ආහාර, බීම සහ දුම්කොළ නිෂ්පාදන සහ පතල් හා කැණීම් කටයුතු ප්‍රධාන වශයෙන් දායක විය. තවද, සේවා අංශයේ වර්ධනය සඳහා මූල්‍ය සේවා, ප්‍රවාහන සේවා සහ පරිගණක වැඩසටහන් හා තොරතුරු තාක්ෂණික සේවාවල ප්‍රසාරණය ප්‍රධාන වශයෙන් හේතු විය.

**සංඛ්‍යා සටහන 01: මූර්ත ද.දේ.නි. වර්ධන ඇස්තමේන්තු (*වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත*, %) (*තාවකාලික*)**

| ආර්ථික කටයුතු | 2025 | | | | | 2026 |
|---|---|---|---|---|---|---|
| | පළමු කාර්තුව | දෙවන කාර්තුව | තුන්වන කාර්තුව | සිව්වන කාර්තුව | වාර්ෂික | පළමු කාර්තුව |
| කෘෂිකාර්මික | -1.3 | 2.5 | 2.2 | 2.1 | 1.4 | 1.1 |
| කර්මාන්ත | 9.8 | 5.7 | 7.9 | 7.3 | 7.8 | 7.2 |
| සේවා | 2.7 | 4.0 | 3.6 | 3.1 | 3.3 | 3.4 |
| **ද.දේ.නි.** | **4.7** | **5.0** | **5.3** | **4.8** | **5.0** | **5.1** |

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

2026 වසරේ දෙවන කාර්තුව සඳහා වන ආර්ථික දර්ශක මගින් පිළිබිඹු කරන පරිදි මැදපෙරදිග යුද්මය තත්ත්වය හමුවේ ඇති වූ අභියෝග මධ්‍යයේ වුව ද, ප්‍රධාන ආර්ථික අංශ තුනෙන් ම ධනාත්මක දායකත්වයක් සහිතව, ආර්ථිකය අඛණ්ඩව ප්‍රසාරණය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. 2025 වසරේ අනුරූප කාලයට සාපේක්ෂව, 2026 වසරේ අප්‍රේල්-මැයි කාලය තුළ, කාර්මික නිෂ්පාදන දර්ශකය මන්දගාමීව වුව ද ධනාත්මක වර්ධනයක් වාර්තා කළේය. ආර්ථික ක්‍රියාකාරකම්වල වර්ධනයන් පිළිබිඹු කරමින්, සෑම වසරක ම පාහේ අප්‍රේල් මාසයේ දී වාර්තා වන පහත වැටීමෙන් අනතුරුව, නිෂ්පාදන, සේවා සහ ඉදිකිරීම් සඳහා වන ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක යළිත් වර්ධනය විය. කෙසේවෙතත්, සංචාරක අංශයේ වර්ධන ප්‍රවණතාවේ මන්දගාමී වීමක් පිළිබිඹු කරමින්, 2026 වසරේ දෙවන කාර්තුවේ සංචාරක පැමිණීම් පහත වැටුණි. තවද, කෘෂිකාර්මික අංශය සඳහා පවතින දර්ශක මගින් සමහර කෘෂිකාර්මික කටයුතුවල වර්ධනයක් මෙන්ම ඇතැම් කෘෂිකාර්මික කටයුතුවල පහත වැටීමක් ද පෙන්නුම් කෙරේ.

**රූප සටහන 16: ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක සහ කාර්මික නිෂ්පාදන දර්ශකයේ වෙනස්වීම්**




මූලයන්: ශ්‍රී ලංකා මහ බැංකුව
ජනලේඛන සහ සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව

ස්ථාවර මිල ගණන් යටතේ වියදම් ප්‍රවේශය සැලකීමේ දී, 2026 වසරේ පළමු කාර්තුවේ දී ආර්ථික ක්‍රියාකාරකම්වල වර්ධනයට ප්‍රධාන සාධකය ලෙස දේශීය ඉල්ලුම පැවති අතර මේ සඳහා පරිභෝජන සහ ආයෝජන දෙකෙහි ම දායකත්වය හේතු විය. පරිභෝජනය ඉහළ යෑම සඳහා පෞද්ගලික පරිභෝජනයේ වර්ධනය ප්‍රධාන වශයෙන් දායක වූ අතර, ආයෝජන ප්‍රසාරණය සඳහා දළ ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනයේ ඉහළ යාම දායක විය. කෙසේ වෙතත්, 2026 වසරේ පළමු කාර්තුවේ දී භාණ්ඩ හා සේවා අපනයන වර්ධන වේගයට සාපේක්ෂව ආනයනවල වර්ධන වේගය ඉහළ යෑම හේතුවෙන් ශුද්ධ විදේශීය ඉල්ලුම තවදුරටත් සංකෝචනය විය. ශුද්ධ විදේශීය ඉල්ලුම සෘණ මට්ටමක පවතිනු ඇතැයි අපේක්ෂා කළ ද, 2026 වසරේ දෙවන කාර්තුවේ දී පරිභෝජනය සහ ආයෝජනය යන අංශ දෙක ම, ආර්ථික ක්‍රියාකාරකම් සඳහා අඛණ්ඩව සහයෝගය ලබා දෙනු ඇතැයි අපේක්ෂා කෙරෙයි.

**සංඛ්‍යා සටහන 02: සමස්ත ඉල්ලුම (තාවකාලික)**

| අයිතමය | ස්ථාවර මිල අනුව (2015) | | | | | |
|---|---|---|---|---|---|---|
| | 2025 | | 2025 පළමු කාර්තුව | | 2026 පළමු කාර්තුව | |
| | රු.බි. | වාර්ෂික ලක්ෂ්‍යමය % | රු.බි. | වාර්ෂික ලක්ෂ්‍යමය % | රු.බි. | වාර්ෂික ලක්ෂ්‍යමය % |
| දේශීය ඉල්ලුම | 13,453 | 6.4 | 3,501 | 6.2 | 3,827 | 9.3 |
| පරිභෝජනය | 10,134 | 5.3 | 2,375 | 2.8 | 2,514 | 5.9 |
| ආයෝජනය (දළ ප්‍රාග්ධන සම්පාදනය) | 3,319 | 9.8 | 1,127 | 14.2 | 1,312 | 16.5 |
| ශුද්ධ විදේශීය ඉල්ලුම | (325) | (138.4) | (25) | (209.8) | (174) | (607.4) |
| + භාණ්ඩ හා සේවා අපනයනය | 3,157 | 5.1 | 822 | 5.9 | 841 | 2.3 |
| - භාණ්ඩ හා සේවා ආනයන | 3,481 | 10.8 | 846 | 12.3 | 1,015 | 19.9 |
| **ද.දේ.නි.** | **13,129** | **5.0** | **3,477** | **4.7** | **3,653** | **5.1** |

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

## 3.3. මුදල් අංශය

**පොලී අනුපාතික**

***2026 වසරේ මුල් කාලයේ ඉහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළ වෙළඳපොළ පොලී අනුපාතික සහ රජයේ සුරැකුම්පත් මත ඵලදා අනුපාතික, 2026 වසරේ මැයි මාසයේ දී සිදු කරන ලද මුදල් ප්‍රතිපත්ති දැඩි කිරීමෙන් අනතුරුව එහි බලපෑම වෙළඳපොළ වෙත සම්ප්‍රේෂණය වීම පිළිබිඹු කරමින් අඛණ්ඩව ඉහළ ගියේය.***

2026 වසරේ මුල් කාලයේ එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය සමඟ සමස්තයක් ලෙස සමපාතව පැවති බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය, මහ බැංකුව විසින් විදේශ විනිමය මිලදී ගැනීම හේතුවෙන් අතිරික්ත ද්‍රවශීලතා මට්ටම් වැඩිදියුණු වීමත් සමඟ එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකයට වඩා පහළ ගියේය. ඉන් අනතුරුව, වෙනස්වන ගෝලීය හා දේශීය තත්ත්වයන් පිළිබිඹු කරමින්, විශේෂයෙන් 2026 වසරේ මැයි මාසයේ දී සිදු කරන ලද ප්‍රතිපත්ති පොලී අනුපාතික ඉහළ දැමීමෙන් පසුව, මහ බැංකුව විසින් බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය, එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකයට ඉහළින් තාවකාලිකව අපගමනය වීමට ඉඩ හරින ලදී. ඒ අනුව, 2026 වසරේ ජූනි මස අවසානය වන විට බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය 9.23%ක උපරිමයකට ළඟා වූ අතර සමස්ත වෙළඳපොළ ද්‍රවශීලතාවයේ වැඩිදියුණු වීමත් සමඟ ක්‍රමයෙන් පහළ ගියේය. 2026 වසරේ ජූලි 21 වන විට, බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය 8.97% ක් වූ අතර, එය එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකයට වඩා පදනම් අංක 22ක් ඉහළින් පැවතුණි.

බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකයේ දක්නට ලැබුණු ඉහළ යෑමට සමගාමීව, බරිත සාමාන්‍ය ප්‍රතිමිලදී ගැනුම් අනුපාතිකය ද 2026 වසරේ මැයි මස අවසානයේ සිට නිත්‍ය ණය පහසුකම් අනුපාතිකයට ආසන්න මට්ටමකට ඉහළ ගියේය. කෙසේවෙතත්, දේශීය මුදල් වෙළඳපොළ තුළ සමස්ත අතිරික්ත ද්‍රවශීලතා මට්ටම්

වැඩිදියුණු වීමත් සමඟ 2026 වසරේ ජූලි 21 වන විට බරිත සාමාන්‍ය ප්‍රතිමිලදී ගැනුම් අනුපාතිකය 9.00%ක් දක්වා පහළ ගියේය.

**රූප සටහන 17: එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකයේ සහ බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකයේ හැසිරීම**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

කෙටි කාලීන ණය සඳහා බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් තම ප්‍රමුඛ ගනුදෙනුකරුවන්ගෙන් අය කරන ණය අනුපාතික පිළිබිඹු කරන සතිපතා බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය පොලී අනුපාතිකය, 2026 වසරේ මුල් කාලයේදී වරින් වර උච්චාවචනයන් පෙන්නුම් කළ ද බොහෝ දුරට ඉහළ යාමේ ප්‍රවණතාවක් පැවතියේය. මෙම ඉහළ යෑමේ ප්‍රවණතාව අඛණ්ඩව පැවතුණු අතර, 2026 වසරේ මැයි මස අවසානයේ සිට වඩාත් තීව්‍ර විය. ඒ අනුව, 2026 වසරේ මේ දක්වා කාලය තුළ අඛණ්ඩ ඉහළ යෑමක් වාර්තා කළ මාසික බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය පොලී අනුපාතිකය වසර ආරම්භයේ සිට ජූනි මස අවසානය දක්වා[10] පදනම් අංක 147කින් ඉහළ ගොස් ඇති අතර, ඉන් පදනම් අංක 59ක ඉහළ යෑමක් සිදු වූයේ ප්‍රතිපත්ති පොලී අනුපාතික දැඩි කිරීමෙන් පසුවය.

2026 වසරේ මුල් මාස කිහිපය තුළ යම් උච්චාවචනයන් පෙන්නුම් කිරීමෙන් අනතුරුව, වෙළඳපොළ පොලී අනුපාතික ක්‍රමයෙන් ඉහළ යාමට පටන් ගත් අතර, 2026 වසරේ මැයි මස අවසානයේ දී සිදු කරන ලද ප්‍රතිපත්ති පොලී අනුපාතික ඉහළ නැංවීමෙන් පසු පොලී අනුපාතික සැලකියයුතු ලෙස ඉහළ ගියේය. ප්‍රතිපත්ති පොලී අනුපාතික ඉහළ යෑම, ණය සහ තැන්පතු පොලී අනුපාතික යන දෙකටම අඛණ්ඩව සම්ප්‍රේෂණය වෙමින් පවතින බව 2026 වසරේ ජූනි මස සඳහා අදාල වන පොලී අනුපාතික දත්ත මගින් පෙන්නුම් කෙරෙන අතර, මීට පෙර ප්‍රතිපත්ති පොලී අනුපාතික දැඩි කිරීම් සිදුකළ කාලපරිච්ඡේද හා සැසඳීමේ දී තැන්පතු පොලී අනුපාතික විශාල වශයෙන් ඉහළ යෑම සඳහා, ශක්තිමත් ණය ඉල්ලුම මධ්‍යයේ 2026 වසරේ ජූනි මාසයේ දී දේශීය බලපත්‍රලාභී වාණිජ බැංකු අතර පැවති අඩු ද්‍රවශීලතා මට්ටම් හේතු විය හැකිය.

[10] 2026 ජූලි මස අවසානය වන විට මාසික බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය පොලී අනුපාතිකය වසරේ ආරම්භයේ සිට මේ දක්වා පදනම් අංක 163ක ඉහළ යෑමක් වාර්තා කරමින් 10.50% දක්වා ඉහළ ගියේය.

**රූප සටහන 18: වෙළඳපොළ පොලී අනුපාතිකවල මාසික වෙනස්වීම සහ ප්‍රතිපත්ති පොලී අනුපාතිකයේ වෙනස්වීම**




*සටහන: සියලුම මාසික පොලී අනුපාතික 2026 ජූනි මස දක්වා වන අතර, බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය, බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය පොලී අනුපාතිකය සහ දින 91 භාණ්ඩාගාර බිල්පත් එලදා අනුපාතිකය 2026 ජූලි 21 වන දින දක්වා වේ.*

මූලයන්: ශ්‍රී ලංකා මහ බැංකුව
රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය

රාජ්‍ය සුරැකුම්පත් මත එලදා අනුපාතික 2026 වසරේ ජනවාරි මස මුල් භාගයේදී වාර්තා වූ ඉහළ යෑමෙන් පසුව ක්‍රමයෙන් පහළ ගිය අතර, ප්‍රධාන වශයෙන් අපේක්ෂිත උද්ධමන අවදානම් සහ ඉහළ ගිය අවිනිශ්චිතතා හේතුවෙන් 2026 වසරේ මාර්තු මස අග සිට අඛණ්ඩව ඉහළ යෑමේ පීඩනයකට මුහුණ දුන්නේය. 2026 වසරේ මැයි මාසයේ දී සිදු වූ ප්‍රතිපත්ති පොලී අනුපාතිකය ඉහළ දැමීමෙන් පසුව, සියලුම කල්පිරීම් යටතේ පවතින භාණ්ඩාගාර බිල්පත් එලදා අනුපාතික විශාල ලෙස ඉහළ ගියේය. මෙමගින් මුදල් ප්‍රතිපත්තිය දැඩි කිරීමේ තීරණය වෙළඳපොළ වෙත සම්ප්‍රේෂණය වීමේ මුල් කාලය තුළදී ප්‍රතිපත්ති පොලී අනුපාතිකය වැඩි කිරීමට සාපේක්ෂව රාජ්‍ය සුරැකුම්පත් එලදා අනුපාතික වැඩි වශයෙන් ඉහළ ගොස් ඇති බව පිළිබිඹු වේ. කෙසේවෙතත්, ඉන් අනතුරුව ආයෝජකයන්ගේ විශ්වාසය වර්ධනය වීමත් සමඟ භාණ්ඩාගාර බිල්පත් එලදා අනුපාතික ක්‍රමයෙන් පහළ යෑමක් දක්නට ලැබුණි. එසේම, ප්‍රතිපත්ති පොලී අනුපාතික ගැළපීමට ප්‍රතිචාර වශයෙන් ප්‍රාථමික වෙළඳපොළේ භාණ්ඩාගාර බැඳුම්කර එලදා අනුපාතික ඉහළ යෑමක් පෙන්නුම් කළ ද, භාණ්ඩාගාර බිල්පත්වලට සමානව මෑත කාලීන වෙන්දේසිවල දී එහි යම් අඩු වීමක් පෙන්නුම් කර ඇත. තවද, මෑත කාලීන වෙන්දේසිවල දී දිගුකාලීන කල්පිරීම් සහිත සුරැකුම්පත්වලට වඩා කෙටිකාලීන කල්පිරීම් සඳහා ආයෝජකයන්ගේ ඉල්ලුම සාපේක්ෂව ඉහළ මට්ටමක පවතී. මෙම ප්‍රවණතාවය ද්විතීයික වෙළඳපොළේ සිදු වූ වර්ධනයන් තුළින් ද පිළිබිඹු වී ඇත. ඒ අනුව, මුදල් ප්‍රතිපත්තිය දැඩි කිරීමෙන් පසුව, ද්විතීයික වෙළඳපොළ එලදා අනුපාතික වක්‍රය ඉහළ ගිය නමුත්, එහි කෙටි කාලීන අන්තය සමඟ සසඳන විට දිගු කාලීන අන්තය සාපේක්ෂව ස්ථාවර මට්ටමක පවතී.

උද්ධමනයේ අඛණ්ඩ ඉහළ යෑමත් සමඟ 2026 වසරේ මේ දක්වා මූර්ත පොලී අනුපාතිකවල පහත වැටීමක් දක්නට ලැබුණි. මූර්ත ණය පොලී අනුපාතිකවල පහළ යෑම මගින් තවදුරටත් ලිහිල්ව පවතින මුදල් තත්ත්වයන් පිළිබිඹු කෙරෙන අතර, එය ණය ඉල්ලුම සඳහා අනුබලයක් සැපයිය හැකිය. කෙසේ වෙතත්, ප්‍රතිපත්ති පොලී අනුපාතිකය ඉහළ නැංවීම වෙළඳපොළ ණය පොලී අනුපාතික වෙත සම්ප්‍රේෂණය වීමත් සමඟ ඉදිරි මාසවල දී

නාමික ණය පොලී අනුපාතික ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරෙන අතර, එමගින් මෙම බලපෑම සමනය වී ණය වර්ධනය මන්දගාමී වනු ඇත.

**රූප සටහන 19: මූර්ත පොලී අනුපාතික**







*සටහන: නාමික පොලී අනුපාතිකය සඳහා වාර්ෂික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය (කො.පා.මි.ද. මත පදනම් වූ) ගැළපීමෙන් මාසික මූර්ත පොලී අනුපාතිකය ගණනය කර ඇත.*

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**දේශීය මුදල් වෙළඳපොළ ද්‍රවශීලතාවය[11]**

***දේශීය මුදල් වෙළඳපොළෙහි අතිරික්ත ද්‍රවශීලතාවය 2026 වසරේ මේ දක්වා කාලය තුළ උච්චාවචනය වෙමින් පැවති අතර, දෙවන කාර්තුවේ දී සැලකිය යුතු ලෙස පහළ ගොස් පසුව යළිත් වර්ධනය විය.***

මහ බැංකුව විසින් සිදු කරන ලද ශුද්ධ පදනමින් විදේශ විනිමය මිලදී ගැනීම් සහ විදේශ විනිමය මිලදී ගැනීමේ සහ අලෙවි කිරීමේ ගිවිසුම් ගනුදෙනු හේතුවෙන් ද්‍රවශීලතාවය ඉහළ යාම ප්‍රධාන වශයෙන් පිළිබිඹු කරමින්, දේශීය මුදල් වෙළඳපොළෙහි සාමාන්‍ය අතිරික්ත ද්‍රවශීලතාවය 2025 වසරේ සිව්වන කාර්තුවේ පැවති රුපියල් බිලියන 120ක පමණ අගයේ සිට 2026 වසරේ පළමු කාර්තුවේ දී රුපියල් බිලියන 251ක් දක්වා ඉහළ ගියේය. දේශීය මුදල් වෙළඳපොළෙහි අතිරික්ත ද්‍රවශීලතාවය ඉහළ යෑමට සහ ඊට අනුරූපව බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය පහළ යෑමට ප්‍රතිචාර වශයෙන්, මහ බැංකුව විසින් 2026 වසරේ පෙබරවාරි මස මැද භාගයේ සිට විවට වෙළඳපොළ කටයුතු හරහා අතිරික්ත ද්‍රවශීලතාවය අවශෝෂණය කිරීම ආරම්භ කළේය. ඉන් අනතුරුව, 2026 වසරේ අප්‍රේල් සිට ජූනි දක්වා කාලය තුළ අතිරික්ත ද්‍රවශීලතාවය ක්‍රමයෙන් පහළ ගියේය. 2026 වසරේ අප්‍රේල් මාසයේ සිට සමස්ත අතිරික්ත ද්‍රවශීලතාවය පහත වැටීම සඳහා නිල සංචිත භාවිතයෙන් සිදු කරන ලද රජයේ ශුද්ධ විදේශ ණය සේවාකරණ ගෙවීම්, දේශීය විදේශ විනිමය වෙළඳපොළ තුළ ශුද්ධ විදේශ විනිමය අලෙවි කිරීම් සහ මහ බැංකුව සතු භාණ්ඩාගාර බැඳුම්කර සඳහා අදාළ කූපන් ගෙවීම් ප්‍රධාන වශයෙන් හේතු විය. ඒ අනුව, 2026 වසරේ මාර්තු මාසයේ දී වාර්තා වූ රුපියල් බිලියන 301ක මාසික සාමාන්‍ය ද්‍රවශීලතා අතිරික්තයට සාපේක්ෂව, 2026 වසරේ ජූනි මාසයේ දී සාමාන්‍ය

[11] දේශීය මුදල් වෙළඳපොළේ ද්‍රවශීලතා තත්ත්වයන් සහ මහ බැංකුවේ මුදල් වෙළඳපොළ මෙහෙයුම් පිළිබඳ වැඩිදුර තොරතුරු 2026 ජූනි - වෙළඳපොළ මෙහෙයුම් වාර්තාවේ ඇතුළත් වේ.

https://www.cbsl.gov.lk/sites/default/files/cbslweb_documents/publications/market_operations_report_june_2026_s.pdf

ද්‍රවශීලතා අතිරික්තය රුපියල් බිලියන 66ක් දක්වා පහළ ගියේය. අප්‍රේල් මාසයේ දී අතිරික්ත ද්‍රවශීලතාවයේ සිදුවූ විශාල පහත වැටීමෙන් පසුව, ද්‍රවශීලතාව අවශෝෂණය කිරීමේ විවට වෙළඳපොළ කටයුතු තාවකාලිකව අත්හිටුවන ලද නමුත්, අතිරික්ත ද්‍රවශීලතාව කළමනාකරණය කිරීමට සහ දේශීය විදේශ විනිමය වෙළඳපොළෙහි පැවති පීඩනයන් ලිහිල් කිරීමට සහාය වෙමින් අප්‍රේල් මස අග භාගයේ දී එම කටයුතු නැවත ආරම්භ කරන ලදී. කෙසේ වෙතත්, මහ බැංකුව විසින් සිදු කළ විදේශ විනිමය මිලදී ගැනීම් හේතුවෙන් 2026 වසරේ ජූලි මස ආරම්භයේ සිට අතිරික්ත ද්‍රවශීලතා මට්ටම යළිත් වර්ධනය විය. ඒ අනුව, 2026 වසරේ ජූලි මස 21 දින වන විට ද්‍රවශීලතා අතිරික්තය රුපියල් බිලියන 142ක් ලෙස සටහන් විය.

**රූප සටහන 20: එක්දින මුදල් වෙළඳපොළ ද්‍රවශීලතාවය, එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය, බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය සහ බරිත සාමාන්‍ය ප්‍රතිමිලදී ගැනුම් අනුපාතිකයෙහි හැසිරීම**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**දේශීය ණය තත්ත්ව සහ මුදල් සැපයුම**

***පෞද්ගලික අංශය වෙත ලබාදුන් ණය සැලකිය යුතු ලෙස ප්‍රසාරණය වීම හේතුවෙන් 2026 වසරේ මේ දක්වා පුළුල් මුදල් ($M_{2b}$) වර්ධනය අඛණ්ඩව ශක්තිමත් විය.***

ආර්ථික ක්‍රියාකාරකම් අඛණ්ඩව යථා තත්ත්වයට පත්වීම සහ ආනයනික සීමා ලිහිල් කිරීමෙන් පසුව වාහන ආනයනය සඳහා ලබා ගන්නා මූල්‍ය පහසුකම් වෙත ඇති ඉල්ලුම ඉහළ යෑම හේතුවෙන්, 2026 වසර තුළ දී පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය අඛණ්ඩව ප්‍රසාරණය විය. මේ අතර, රාජ්‍ය අංශය වෙත ලබා දුන් ණය ප්‍රමාණය පහළ යෑම, පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය තවදුරටත් ප්‍රසාරණය වීම සඳහා අමතර අවකාශයක් නිර්මාණය කරන ලදී. ඒ අනුව, 2026 මැයි මස අවසානය වන විට 27.8%ක ඉහළ වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනයක් වාර්තා කරමින්, 2026 වසරේ පළමු මාස පහ තුළ බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණයවල සමස්ත ප්‍රසාරණය රුපියල් බිලියන 824.1ක් විය.[12] තවද, එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණ වීම

[12] 2026 වසරේ පළමු භාගය තුළ බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශය වෙත සපයන ලද ණය රුපියල් බිලියන 1,069.4 කින් ඉහළ ගිය අතර, 2026 ජූනි අවසානය වන විට 27.4% ක වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනයක් වාර්තා කළේය.

හේතුවෙන් විදේශීය ව්‍යවහාර මුදලින් නාමනය කරන ලද ණය වත්කම්වල රුපියල් වටිනාකම තක්සේරු කිරීමේ දී ඇති වූ බලපෑම ණය සමස්තයෙහි ප්‍රසාරණයට දායක වී ඇත.

පෞද්ගලික අංශය සඳහා ලබා දෙන ණයවල අංශ අනුව වර්ගීකරණය කිරීමේ දී, 2026 වසරේ ජනවාරි සිට මැයි දක්වා කාලය තුළ පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය සමස්ත ප්‍රමාණයෙන් ඉහළ ප්‍රතිශතයක් පෞද්ගලික ණය සහ අත්තිකාරම් වෙත හිමි විය. මෙම කාණ්ඩය තුළ, රන් සුරැකුම් මත ලබා දුන් ණය/උකස් සහ පාරිභෝගික භාණ්ඩ සඳහා ලබා දුන් ණය සැලකිය යුතු වර්ධනයක් වාර්තා කළේය. 2026 වසරේ පළමු කාර්තුවේ දී ගෝලීය රත්‍රන් මිල ඉහළ යෑම, රන් සුරැකුම් මත ලබා දුන් ණය ප්‍රසාරණය සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය හැකිය. සමස්ත ණය ප්‍රසාරණයෙන් දෙවන විශාලතම ණය ප්‍රසාරණය සේවා අංශය සඳහා ලබාදුන් ණය වන අතර, මූල්‍ය හා ව්‍යාපාර සේවා මෙන්ම සංචාරක කර්මාන්තය වෙත ලබා දුන් ණය ද ඒ සඳහා දායක වී ඇත. මේ අතර, කර්මාන්ත අංශය වෙත ලබා දුන් ණය ප්‍රසාරණය වීම සඳහා ප්‍රධාන වශයෙන් ඉදිකිරීම්, රසායනික, ඛනිජතෙල්, ඖෂධ සහ සෞඛ්‍ය සේවා; රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන; සහ ආහාර හා පාන වර්ග යන උප අංශ වෙත ලබා දුන් ණය ඉහළ යෑම හේතු වී ඇත.

2026 වසරේ පළමු මාස පහ තුළ පෞද්ගලික ණය සහ අත්තිකාරම් ලෙස ලබා දුන් ණය ප්‍රමාණය සමස්ත ණය ප්‍රසාරණයට ප්‍රධාන වශයෙන් දායක වුවද, සේවා සහ කර්මාන්ත අංශ වෙත ණය ගලායෑම ඉහළ යෑම හේතුවෙන් ව්‍යාපාර ආශ්‍රිත අංශ වෙත ලබා දුන් ණය ප්‍රමාණය මෑත කාලයේ දී සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. මේ අතර, සලකා බලන කාල සීමාව තුළ අඩුම ණය ප්‍රසාරණය කෘෂි හා ධීවර අංශය වාර්තා කළේය. තවද, වාහන මිලදී ගැනීම සඳහා වූ මූල්‍යකරණය ඉහළ යෑම සහ රන් සුරැකුම් මත ලබා දුන් ණය ඉහළ යෑම පිළිඹිබු කරමින්, මුදල් සමාගම් විසින් පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණයෙහි ඉහළ යෑමක් වාර්තා විය.

**රූප සටහන 21: බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශයට ලබා දුන් සමස්ත ණයෙහි මාසික වෙනස්වීම**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 22: බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් අංශ අනුව පෞද්ගලික අංශයට ලබාදුන් ණයෙහි කාර්තුමය වෙනස**




*සටහන: ගණනය කිරීමේ ක්‍රමවේදයන්හි වෙනස්කම් හේතුවෙන්, මාසික සමීක්ෂණයේ දැක්වෙන පෞද්ගලික අංශය වෙත සපයන ලද සමස්ත ණය, මුදල් සමීක්ෂණයේ ඇති එම අගයට වඩා වෙනස් වේ.*

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

බලපත්‍රලාභී වාණිජ බැංකු සහ මහ බැංකුව යන දෙඅංශය විසින් ම රජයට ලබා දුන් ශුද්ධ ණය අඩුවීම හේතුවෙන්, 2026 වසරේ ජනවාරි සිට මැයි දක්වා කාලය තුළ බැංකු පද්ධතිය මගින් රජයට ලබා දුන් ශුද්ධ ණය ප්‍රමාණය පහළ ගියේය. මෙම කාල සීමාව තුළ බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් රජයට ලබා දුන් ශුද්ධ ණය අඩුවීම සඳහා බලපත්‍රලාභී වාණිජ බැංකු සතු රජයේ සුරැකුම්පත් තොගයේ පහළ යෑම ප්‍රධාන වශයෙන් හේතු වූ අතර, රජයේ තැන්පතු අඩු වීම මගින් එලෙස රජයට ලබා දුන් ශුද්ධ ණය පහළ යෑමේ බලපෑම යම් දුරකට අඩු විය. මහ බැංකුව විසින් රජය වෙත ලබා දුන් ශුද්ධ ණය පහත වැටීම සඳහා මහ බැංකුව සතු රජයේ සුරැකුම්පත්වල එලදා අනුපාතික ඉහළ යෑම හේතුවෙන්, එම සුරැකුම්පත්වල වෙළඳපොළ වටිනාකම් වෙනස්වීම, ප්‍රධාන වශයෙන් හේතු විය.

මේ අතර, ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව, ශ්‍රීලංකන් ගුවන් සේවය, මාර්ග සංවර්ධන අධිකාරිය, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සහ රාජ්‍ය පොහොර සමාගම විසින් සිදු කරන ලද ශුද්ධ පදනම මත ණය ආපසු ගෙවීම් හේතුවෙන්, 2026 වසරේ පළමු මාස පහ තුළ බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් රජය සතු වාණිජ ව්‍යාපාර වෙත ලබා දුන් ණය ද පහළ ගියේය.

2026 වසරේ මැද භාගය වන විට යම් පහළ යෑමක් දක්නට ලැබුණ ද, 2026 වසරේ මේ දක්වා කාලය තුළ බැංකු පද්ධතියේ ශුද්ධ විදේශීය වත්කම් ද ඉහළ ගියේය. මහ බැංකුවේ සහ බලපත්‍රලාභී වාණිජ බැංකුවල ශුද්ධ විදේශීය වත්කම් ඉහළ යෑම හේතුවෙන්, 2026 වසරේ මුල් මාස පහ තුළ බැංකු පද්ධතියේ ශුද්ධ විදේශීය වත්කම් ප්‍රසාරණය විය. මූලික වශයෙන්, විදේශ මුදල් තැන්පත් කිරීම් ඉහළ යෑමත් සමඟ අනේවාසිකයන් වෙත ලබා දුන් ණය ප්‍රමාණය ඉහළ යෑම හේතුවෙන් බලපත්‍රලාභී වාණිජ බැංකුවල ශුද්ධ විදේශීය වත්කම් ප්‍රසාරණය විය. මේ අතර, මහ බැංකුව විසින් දේශීය විදේශ විනිමය වෙළඳපොළෙන් විදේශ විනිමය ශුද්ධ පදනමින් මිලදී ගැනීම ප්‍රධාන වශයෙන් පිළිබිඹු කරමින් මහ බැංකුවේ ශුද්ධ විදේශීය වත්කම් ඉහළ ගියේය.

මෙම ප්‍රවණතාවන්ට අනුකූලව, ප්‍රධාන වශයෙන් පෞද්ගලික අංශයට ලබාදුන් ණයවල සිදු වූ සැලකිය යුතු ප්‍රසාරණය සහ ශුද්ධ විදේශීය වත්කම්වල වැඩි වීම හේතුවෙන් පුළුල් මුදල් සැපයුම ($M_{2b}$) 2026 වසරේ මැයි මාසයේ දී 12.0%ක වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනයක් වාර්තා කළේය.

**රූප සටහන 23: පුළුල් මුදල් සැපයුමේ (*$M_{2b}$*) වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය සඳහා දායකත්වය**




*සටහන: සම්මත මුදල් සමාහාර ගණනය කිරීමේ දී වෙනත් ස්ථානයක පැහැදිලිව වර්ගීකරණය කර නොමැති සියලුම වත්කම් සහ වගකීම්, අනෙකුත් අයිතම (ශුද්ධ) යටතට ඇතුළත් වේ.*

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## 3.4. විදේශීය අංශය

***ප්‍රධාන වශයෙන්, මැදපෙරදිග යුද්මය තත්ත්වය ශ්‍රී ලංකාවේ විදේශීය අංශය කෙරෙහි එල්ල කරන බලපෑම පිළිබිඹු කරමින්, 2026 වසරේ පළමු භාගය තුළ ජංගම ගිණුමේ හිඟයක් වාර්තා විය. මූල්‍ය ගිණුම වෙත වූ ලැබීම් මන්දගාමී වූ අතර, විදේශීය ණය සේවාකරණ ගෙවීම් මධ්‍යයේ දළ නිල සංචිත ප්‍රමාණය මඳක් අඩු විය. වසරේ මේ දක්වා කාලය තුළ ශ්‍රී ලංකා රුපියල එ.ජ. ඩොලරයට සාපේක්ෂව අවප්‍රමාණය වුවද, මෑතක දී ක්‍රියාත්මක කරන ලද මුදල්, රාජ්‍ය මූල්‍ය සහ සාර්ව විචක්ෂණ ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග හේතුවෙන් රුපියලෙහි විචල්‍යතාව අඩුවීමත් සමඟ, රුපියල අවප්‍රමාණය වීමේ වේගය මෑත කාලීනව අඩු වී ඇත.***

**ගෙවුම් තුලනය**

2026 වසරේ පළමු භාගය තුළ ජංගම ගිණුම එ.ජ. ඩොලර් මිලියන 245ක හිඟයක් වාර්තා කළේය. විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ලැබීම්වල කැපී පෙනෙන වර්ධනයක් දක්නට ලැබුණ ද, ඉන්ධන සහ වාහන ආනයන ඉහළ යෑම හේතුවෙන් වෙළඳ හිඟය පුළුල් වීම මෙන්ම සංචාරක ඉපැයීම් අඩුවීම සහ සේවා ගෙවීම් වැඩිවීම ඒ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. අපනයන ආදායම්වලට වඩා වේගයෙන් ආනයන වියදම් ඉහළ යෑම නිසා 2026 වසරේ පළමු භාගයේ දී වෙළඳ භාණ්ඩ ගිණුමේ හිඟය එ.ජ. ඩොලර් බිලියන 5.5ක් දක්වා පුළුල් විය. 2026 වසරේ පළමු භාගය තුළ ආනයන වියදම එ.ජ. ඩොලර් බිලියන 12.4ක් වූ අතර, සමස්ත අපනයන ආදායම එ.ජ. ඩොලර් බිලියන 6.9ක් විය.

**රූප සටහන 24: වෙළඳ ගිණුම**




මූලයන්: ශ්‍රී ලංකා මහ බැංකුව
ශ්‍රී ලංකා රේගුව

මැදපෙරදිග යුද තත්ත්වය මධ්‍යයේ ගෝලීය තෙල් මිල ඉහළ යෑම පිළිබිඹු කරමින්, සමස්ත ආනයන වියදමට 25.6%ක දායකත්වයක් දක්වමින් 2026 වසරේ පළමු භාගයේ දී ඉන්ධන ආනයන වියදම 58.8%කින් (වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත) එ.ජ. ඩොලර් බිලියන 3.2 දක්වා ඉහළ ගියේය. තවද, පෞද්ගලික රථවාහන සහ වාණිජ කටයුතු සඳහා යොදා ගන්නා වාහන ආනයන වියදම 2026 වසරේ පළමු භාගයේ දී එ.ජ. ඩොලර් බිලියන 1.3ක් විය. 2026 වසරේ මැයි මාසයේ දී, රජය විසින් මෝටර් රථ සඳහා අදාළ වන රේගු ආනයන බද්ද මත තාවකාලික 50%ක අධිභාරයක් පනවන ලදී. සාර්ව විචක්ෂණශීලී පියවරක් ලෙස, 2026 වසරේ මැයි මාසයේ දී මහ බැංකුව විසින් වාහන මූල්‍යකරණය සඳහා අදාළ වන වටිනාකම් මත උපරිම ණය අනුපාත සීමාවන් ද දැඩි කරන ලදී. එයට අමතරව, 2026 වසරේ මැයි මාසයේ දී ප්‍රතිපත්ති පොලී අනුපාතික ඉහළ දැමීම හේතුවෙන් මූල්‍යකරණ පිරිවැය ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ. සමස්තයක් ලෙස ගත් කළ මෙම ක්‍රියාමාර්ග හේතුවෙන්, 2026 වසරේ ජූනි මස නිරීක්ෂණය කෙරුණු වාහන ආනයන වියදම්වල පහළ යෑම මගින් ද පිළිබිඹු කරන පරිදි, ඉදිරි කාලයේ දී වාහන ආනයන සඳහා වන ඉල්ලුම පහළ ගොස් එහි ප්‍රතිඵලයක් වශයෙන් විදේශීය ජංගම ගිණුම මත පීඩන ලිහිල් වෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**රූප සටහන 25: මාසික රථවාහන ආනයන වියදම**




මූලයන්: ශ්‍රී ලංකා මහ බැංකුව
ශ්‍රී ලංකා රේගුව

ප්‍රධාන වශයෙන්, මැදපෙරදිග පවතින යුද්ධමය තත්ත්වය හමුවේ සංචාරක පැමිණීම් අඩුවීම පිළිබිඹු කරමින්, 2026 වසරේ පළමු භාගය තුළ සංචාරක ඉපැයීම් 11.8%කින්[13] (වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත) එ.ජ. ඩොලර් බිලියන 1.5ක් දක්වා අඩුවිය. අනෙක් අතට, විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ, 2026 වසරේ ජූනි මාසය වන විට 23.2%ක (වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත) ශක්තිමත් වර්ධනයක් වාර්තා කරමින් එ.ජ. ඩොලර් බිලියන 4.6ක්[14] දක්වා ඉහළ ගියේය.

[13] මාසික ඇස්තමේන්තුවල නිරවද්‍යභාවය සහ නියෝජනය වැඩි දියුණු කිරීම සඳහා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් සංචාරක ඉපැයීම් ඇස්තමේන්තු සම්පාදනය කිරීමේ ක්‍රමවේදය 2026 මැයි මාසයේ දී සංශෝධනය කළ අතර, එම සංශෝධිත ප්‍රවේශය 2026 වසරේ ජනවාරි සිට ඇස්තමේන්තු සම්පාදනය කිරීමට යොදාගෙන ඇත.

[14] විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණවලට දිට්වා සුළි කුණාටුවෙන් පසුව ලැබුණු ප්‍රේෂණ වැනි වෙනත් ප්‍රේෂණ ඇතුළත් විය හැකිය.

**රූප සටහන 26: සංචාරක කර්මාන්තය සහ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ**




මූලයන්: ශ්‍රී ලංකා මහ බැංකුව
ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

මූලයන්: ශ්‍රී ලංකා මහ බැංකුව
බලපත්‍රලාභී බැංකු

**රූප සටහන 27: විදේශීය ජංගම ගිණුම**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

මූල්‍ය ගිණුමේ කාර්යසාධනය වසරේ මේ දක්වා කාලය තුළ මන්දගාමීව පැවතුණි. 2026 වසරේ පළමු කාර්තුවේ දී සෘජු ආයෝජන ව්‍යවසායයන් වෙත ලැබුණු විදේශීය ණය ඇතුළු විදේශීය සෘජු ආයෝජන, පසුගිය වසරේ අනුරූප කාලයට සාපේක්ෂව ඉහළ යෑමක් පෙන්නුම් කළ ද, සමස්තයක් ලෙස මන්දගාමීව පැවතුණි. මේ අතර, රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළෙහි හා ප්‍රාථමික හා ද්විතියික වෙළඳපොළ ගනුදෙනු ඇතුළත් කොළඹ කොටස්

වෙළඳපොළෙහි විදේශීය ආයෝජන, 2026 වසරේ ජනවාරි මස සිට ජූනි මාසය දක්වා කාලය තුළ ශුද්ධ ගෙවීම් වාර්තා කළේය. කෙසේවෙතත්, 2026 වසරේ ජූලි මස 01වන දින සිට 21වන දින දක්වා කාලය තුළ රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළෙහි විදේශීය ආයෝජන ශුද්ධ ලැබීම් වාර්තා කළේය.

**රූප සටහන 28: මූල්‍ය ගිණුම**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**විනිමය අනුපාතිකය**

වසරේ පළමු මාස දෙක තුළ එ.ජ. ඩොලරයට සාපේක්ෂව මාසික අතිප්‍රමාණය වීමක් වාර්තා කළ ශ්‍රී ලංකා රුපියල, මැදපෙරදිග යුද්ධය ආරම්භ වීමත් සමග සැලකිය යුතු අවප්‍රමාණය වීමේ පීඩනයන්ට මුහුණ දුන්නේය. විශේෂයෙන් ම, ඉන්ධන සහ මෝටර් රථ සඳහා වූ ඉහළ ආනයන වියදම්, 2026 වසරේ මාර්තු - ජූනි කාලය තුළ දී සංචාරක ඉපැයීම් අඩුවීම සහ රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළෙහි හා කොළඹ කොටස් වෙළඳපොළෙහි විදේශීය ආයෝජන ගෙවීම් මෙම පීඩන සඳහා හේතු විය. මීට අමතරව, වෙළඳපොළ අවිනිශ්චිතතා ඉහළ යෑමත් සමඟ සමපේක්ෂණ ගනුදෙනු ඉහළ ගිය අතර, අපනයන ආදායම් ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කිරීම ප්‍රමාද කෙරුණි. තවද, ඇතැම් ආනයනකරුවන් විසින් විනිමය අනුපාත අවදානම් කළමනාකරණය කර ගැනීම සඳහා ආනයන ඇණවුම් කඩිනම් කිරීම සහ විදේශ විනිමය මිලදී ගැනීම් වැඩි කර ගැනීම හේතුවෙන් විදේශ විනිමය සඳහා ඉහළ ඉල්ලුමක් ඇති විය. ඒ අනුව, 2026 වසරේ ජූලි මස 21වන දිනට, එ.ජ. ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල 7.8%කින් අවප්‍රමාණය විය.[15] 2026 වසරේ මාර්තු මාසයේ සිට අඛණ්ඩව මාස හතරක් පුරා ශ්‍රී ලංකා රුපියල එ.ජ. ඩොලරයට සාපේක්ෂව අවප්‍රමාණය වූ අතර ඒ හේතුවෙන් සමස්ත අවප්‍රමාණය වීමක් වාර්තා කළ ද, අපනයන ඉපැයීම් ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කිරීමේ කාලසීමාව අඩු කිරීම ඇතුළුව මෑතක දී ක්‍රියාත්මක කරන ලද ප්‍රතිපත්තිමය පියවරවල සහාය ඇතිව, 2026 වසරේ ජූලි මාසය තුළ දී (2026 වසරේ ජූලි මස 21වන දින දක්වා) ශ්‍රී ලංකා රුපියල එ.ජ. ඩොලරයට සාපේක්ෂව සුළු වශයෙන් අතිප්‍රමාණය වීමක් වාර්තා කළේය. අනෙකුත් විදේශ ව්‍යවහාර මුදල්වල හැසිරීම පිළිබිඹු කරමින්, මෙම කාලය තුළ දී ශ්‍රී ලංකා රුපියල අනෙකුත් ප්‍රධාන මුදල් වර්ගවලට සාපේක්ෂව අවප්‍රමාණය විය. ශ්‍රී ලංකාව සහ එහි වෙළඳ හවුල්කරුවන්

[15] 2026 වසරේ අගෝස්තු මස 12වන දිනට, එ.ජ. ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල 7.4%කින් අවප්‍රමාණය විය.

අතර පැවති උද්ධමන වෙනසෙහි ධන අගය ශ්‍රී ලංකා රුපියලෙහි නාමික අවප්‍රමාණය වීම ඉක්මවා යැම හේතුවෙන්, 2026 වසරේ ජූලි මස 21වන දින දක්වා කාලය තුළ දී නාමික සඵල විනිමය අනුපාතිකය පහළ ගිය අතර, මූර්ත සඵල විනිමය අනුපාතිකය ඉහළ ගියේය.

**රූප සටහන 29: විනිමය අනුපාතිකයේ හැසිරීම***




*රූප සටහන් 2026 වසරේ ජූලි මස 21වන දින දක්වා යාවත්කාලීන කර ඇත.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**සංචිත වත්කම්**

2026 වසරේ පෙබරවාරි මස අවසානය වන විට එ.ජ. ඩොලර් බිලියන 7.3ක් පමණ දක්වා ඉහළ ගොස් තිබූ දළ නිල සංචිත,[16] විදේශීය ව්‍යවහාර මුදලින් ලබාගත් ණය සේවාකරණ ගෙවීම් හේතුවෙන් 2026 වසරේ ජූනි මස අවසානය වන විට එ.ජ. ඩොලර් බිලියන 6.5ක් පමණ දක්වා පහළ ගියේය. 2026 වසරේ පළමු භාගය තුළ මහ බැංකුව විසින් දේශීය විදේශ විනිමය වෙළෙඳපොළෙන් එ.ජ. ඩොලර් මිලියන 556ක විදේශ විනිමය ශුද්ධ පදනමින් (වටිනාකම නිර්ණය වන දිනය මත පදනම්ව) මිලදී ගන්නා ලදී. මෙම කාල සීමාව තුළ දළ නිල සංචිත වෙත ලැබුණු අනෙකුත් ප්‍රධාන ලැබීම් අතරට, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම යටතේ ලබා දුන් වාරික දෙකෙහි සමස්ත වටිනාකම වන එ.ජ. ඩොලර් මිලියන 695ද ඇතුළත් විය.

[16] චීන මහජන බැංකුව සමඟ වූ විදේශ විනිමය හුවමාරු පහසුකම මෙයට ඇතුළත් වේ.

**රූප සටහන 30: මාසික දළ නිල සංචිත, සංචිත ප්‍රමාණාත්මකභාවය සහ ශුද්ධ විදේශ විනිමය මිලදී ගැනීම්**




*සටහන: චීන මහජන බැංකුවෙන් ලද විදේශ විනිමය හුවමාරු පහසුකම දළ නිල සංචිතවලට ඇතුළත් වේ.*

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

### 3.5. රාජ්‍ය මූල්‍ය අංශය

***අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලද ආදායම් මත පදනම් වූ රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාමාර්ග හේතුවෙන්, 2025 වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී, 2026 වසරේ පළමු මාස පහ තුළ දී රාජ්‍ය මූල්‍ය අංශයේ කාර්යසාධනය තවදුරටත් ශක්තිමත් විය.***

2025 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව, 2026 වසරේ මැයි මාසයෙන් අවසන් වූ මාස පහක කාලපරිච්ඡේදය තුළ දී රජයේ මුළු ආදායම සහ ප්‍රදාන 30.6%කින් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. 2026 වසරේ පළමු මාස පහ තුළ දී රජයේ ප්‍රධාන ආදායම් මූලාශ්‍රය වන බදු ආදායම 28.9%ක කැපී පෙනෙන වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනයක් වාර්තා කළේය. අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලද බදු ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවල බලපෑම, බදු පරිපාලනය වැඩිදියුණු වීම සහ ආර්ථික ක්‍රියාකාරකම් ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වීම පිළිබිඹු කරමින් එකතු කළ අගය මත බද්ද, නිෂ්පාදන/සුරා බදු, ආනයන බදු සහ ආදායම් බදුවලින් එකතු වූ බදු ආදායම් වැඩි වීම බදු ආදායමේ කාර්යසාධනය ඉහළ යෑම සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. විශේෂයෙන් ම, එකතු කළ අගය මත බද්ද, නිෂ්පාදන බදු සහ ආනයන බදු මගින් ලද ආදායමේ කැපී පෙනෙන වර්ධනය සඳහා, අපේක්ෂිත මට්ටම ඉක්මවමින් සිදු වූ වාහන ආනයනය හේතුවෙන්, වාහන ආනයනයට අදාළ බදුවලින් රැස් කර ගත් ඉහළ බදු ආදායම ප්‍රධාන වශයෙන් දායක විය. මේ අතර, සලකා බලන කාලපරිච්ඡේදයේ දී වියදම් සහ ශුද්ධ ණය දීම් වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත 7.4%කින් සුළු වශයෙන් ඉහළ ගිය අතර, ඒ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වූයේ සහනාධාර සහ පැවරුම් මෙන්ම වැටුප් සහ වේතන ගෙවීම් සඳහා වන වියදම් ඉහළ යෑමයි. තවද, 2025 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව, 2026 වසරේ පළමු මාස පහ තුළ දී ප්‍රාග්ධන වියදම් සහ ශුද්ධ ණය දීම් 29%කින් ඉහළ ගියේය.

ඒ අනුව, මෙම කාලපරිච්ඡේදය තුළ දී ප්‍රාථමික ශේෂය රුපියල් බිලියන 1,131.2ක කැපී පෙනෙන අතිරික්තයක් වාර්තා කළේය. 2026 වසරේ මැයි මාසයේ දී සමස්ත අයවැය ශේෂය අඛණ්ඩව සිව්වන මාසයටත් රුපියල්

බිලියන 197.3ක අතිරික්තයක් වාර්තා කළ අතර, 2026 වසරේ පළමු මාස පහ තුළ දී ජංගම ගිණුමේ ශේෂය රුපියල් බිලියන 422.8ක අතිරික්තයක් වාර්තා කළේය.

රූප සටහන 31: ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ශේෂයන්




මූලය: මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

ශුද්ධ දේශීය මූල්‍යනය, 2025 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී වාර්තා වූ රුපියල් බිලියන 298.6ට සාපේක්ෂව 2026 වසරේ මැයි මාසයෙන් අවසන් වන මාස පහ තුළ දී, රුපියල් බිලියන 197.3ක ශුද්ධ ණය ආපසු ගෙවීමක් ලෙස වාර්තා විය. 2026 වසරේ මැයි මාසයෙන් අවසන් වන පළමු මාස පහ තුළ දී, විදේශීය මූල්‍යනය, 2025 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී වාර්තා වූ රුපියල් බිලියන 62.0ක ශුද්ධ ණය ආපසු ගෙවීමට සාපේක්ෂව රුපියල් බිලියන 0.1ක ශුද්ධ ණය ආපසු ගෙවීමක් ලෙස වාර්තා විය. මේ අතර, 2025 වසර අවසානයේ දී රුපියල් බිලියන 32,195ක් ලෙස වාර්තා වූ සමස්ත රාජ්‍ය ණය[17] 2026 වසරේ මාර්තු මාසය අවසානය වන විට රුපියල් බිලියන 32,233ක් දක්වා ඉහළ ගියේය.

## 3.6. මූල්‍ය අංශය

***බාහිර සහ දේශීය තත්ත්ව හේතුවෙන් මතු වූ අභියෝග මධ්‍යයේ වුව ද මූල්‍ය අංශයේ ඔරොත්තු දීමේ හැකියාව අඛණ්ඩව පැවතුණි.***

බැංකු අංශයේ ඔරොත්තු දීමේ හැකියාව 2026 වසරේ පළමු භාගයේ දී අඛණ්ඩව පෙන්නුම් කෙරුණු අතර, ගෝලීය අවිනිශ්චිතතා තීව්‍ර වීම මධ්‍යයේ වුව ද ණය වර්ධනය ශක්තිමත් වීම, වත්කම්වල ගුණාත්මකභාවය ඉහළ යෑම සහ ලාභදායීත්වය ස්ථායී වීම ඒ සඳහා දායක වී ඇත. ප්‍රධාන වශයෙන්, ණය සහ ලැබීම්වල සැලකිය යුතු ඉහළ යෑම හේතුවෙන්, බැංකු අංශයේ මුළු වත්කම්, 2026 වසරේ පළමු භාගයේ දී ප්‍රසාරණය විය. ඒ අනුව, 2026 වසරේ ජූනි මස අවසානයේ දී සමස්ත වත්කම් 9.3%ක වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනයක් වාර්තා කළ අතර, එහි වටිනාකම රුපියල් ට්‍රිලියන 26.0ක් විය. තවද, දළ ණය සහ ලැබීම් 23.6%ක වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනයක් පෙන්නුම් කරමින් 2026 වසරේ ජූනි මස අවසානයේ දී රුපියල් ට්‍රිලියන 15.3ක් දක්වා ප්‍රසාරණය විය.

[17] රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය විසින් ප්‍රකාශයට පත් කරනු ලබන කාර්තුමය ණය සංඛ්‍යාලේඛන ප්‍රකාශනයට අනුව

ශක්තිමත් ණය වර්ධනය සහ අදියර 3 යටතේ පවතින ණය ප්‍රමාණය  අඩු වීම හේතුවෙන්, අදියර 3 ණය අනුපාතය තුළින් පිළිබිඹු වන බැංකු අංශයේ සමස්ත ණය පැහැර හැරීමේ අවදානම, 2025 වසරේ පළමු භාගය තුළ දී වාර්තා වූ 12.0%ක අගයේ සිට 2026 වසරේ පළමු භාගය වනවිට 9.0%ක් දක්වා අඩු විය. 2026 වසරේ පළමු භාගය තුළ දී බැංකු අංශය 6.9%ක වාර්ෂික වර්ධනයක් පෙන්නුම් කරමින්, රුපියල් බිලියන 200.6ක බදු පසු ලාභයක් වාර්තා කළේය. කෙසේ වෙතත්, හිමිකම් මත ප්‍රතිලාභ, වත්කම් මත ප්‍රතිලාභ සහ ශුද්ධ පොලී ආන්තිකය යන ලාභදායීත්ව දර්ශක 2025 වසරේ පළමු භාගයට සාපේක්ෂව, 2026 වසරේ පළමු භාගයේ දී සුළු වශයෙන් පහළ ගියේය.

ද්‍රවශීලතා මට්ටම් අවම නියාමන අවශ්‍යතාවට වඩා සැලකිය යුතු ඉහළ මට්ටමක පවතින පසුබිමක නියාමන ද්‍රවශීලතා අවශ්‍යතාව සපුරාලීම සඳහා වන වත්කම්, ණය ප්‍රසාරණය සඳහා යළි වෙන් කිරීම හේතුවෙන් ද්‍රවශීලතා ආවරණ අනුපාත මගින් මනිනු ලබන බැංකු අංශයේ ද්‍රවශීලතාව, 2025 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව 2026 වසරේ පළමු භාගයේ දී පහළ ගියේය. ඒ අනුව, රුපියල් ද්‍රවශීලතා ආවරණ අනුපාතය 2025 වසරේ පළමු භාගය අවසානයේ වාර්තා වූ 328.6%ට සාපේක්ෂව, 2026 වසරේ පළමු භාගය අවසානයේ දී 273.0%ක් දක්වා පහළ ගිය අතර, සියලු මුදල් ද්‍රවශීලතා ආවරණ අනුපාතය 2025 වසරේ පළමු භාගය අවසානයේ වාර්තා වූ 283.1%ක අගයේ සිට 2026 වසරේ පළමු භාගය අවසානයේ දී 230.0%ක් දක්වා පහළ ගියේය. මේ අතර, බැංකු අංශයේ සමස්ත ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය පෙර වසරේ වාර්තා වූ 19.4%ක අගයේ සිට 2026 වසරේ ජූනි අවසානය වනවිට 17.3%ක් දක්වා පහළ ගිය අතර, ණය වර්ධනය ඉහළ යෑමේ සහාය ඇතිව, සමස්ත නියාමන ප්‍රාග්ධනයට සාපේක්ෂව අවදානම් මත බර තැබූ වත්කම් වේගයෙන් වර්ධනය වීම එයට හේතු විය.

ප්‍රධාන වශයෙන් ණය සහ අත්තිකාරම්වල ඉහළ යෑම හේතුවෙන් 2026 වසරේ පළමු භාගය අවසානයේ දී මුදල් සමාගම් අංශයේ වත්කම් 41.0%ක වාර්ෂික ලක්ෂ්‍යමය ප්‍රසාරණයක් වාර්තා කළේය. ඒ අනුව, වාහන සහ රන් සුරැකුම් මත ණය ඉහළ යෑම හේතුවෙන් මෙම අංශයේ දළ ණය සහ අත්තිකාරම් 2026 වසරේ පළමු භාගය අවසානයේ දී 45.0%ක සැලකිය යුතු වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනයක් වාර්තා කළේය. වත්කම් ගුණාත්මකභාවයේ වර්ධනයක් පෙන්නුම් කරමින්, මෙම අංශයේ දළ අදියර 3 ණය අනුපාතය, 2025 වසරේ පළමු භාගය අවසානයේ වාර්තා වූ 8.3%ට සාපේක්ෂව, 2026 වසරේ පළමු භාගය අවසානය වනවිට 5.1%ක් දක්වා පහළ ගිය අතර, ප්‍රධාන වශයෙන් ශක්තිමත් ණය වර්ධනය සහ අදියර 3 යටතේ පවතින ණයවල ශේෂය අඩු වීම එයට හේතු විය. එමෙන්ම මුදල් සමාගම් අංශයේ ද්‍රවශීලතා තත්ත්වය 2026 වසරේ පළමු භාගය අවසානයේ දී රුපියල් බිලියන 100.5ක ද්‍රවශීලතා වත්කම් අතිරික්තයක් වාර්තා කරමින් අවම නියාමන අවශ්‍යතාවට වඩා ඉහළ අගයක පැවතුණි. මේ අතර, 2026/27 මුදල් වර්ෂයේ පළමු මාස තුන සඳහා (2026 අප්‍රේල්-ජූනි) 16.4%ක වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනයක් පෙන්නුම් කරමින්, මෙම අංශය වාර්තා කළ බදු පසු ලාභය රුපියල් බිලියන 21.0ක් විය. ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාව සම්බන්ධයෙන් ගත් කළ, මුදල් සමාගම් අංශයේ ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය 2025 වසරේ පළමු භාගය අවසානයේ වාර්තා කළ 22.0%ට සාපේක්ෂව, 2026 වසරේ පළමු භාගය අවසානයේ දී 19.3%ක් දක්වා පහළ ගිය අතර, සැලකිය යුතු ණය ප්‍රසාරණය හේතුවෙන් අවදානම් මත බර තැබූ වත්කම් වේගයෙන් වර්ධනය වීම (සමස්ත නියාමන ප්‍රාග්ධනයට සාපේක්ෂව) ඒ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය.

**සංඛ්‍යා සටහන 03: බැංකු සහ මුදල් සමාගම් අංශවල මූල්‍ය ශක්තිමත්භාවය පිළිබඳ ප්‍රධාන දර්ශක**

| ප්‍රධාන දර්ශක (%) | 2025 වසරේ ජූනි මස අවසානයේ දී | 2026 වසරේ ජූනි මස අවසානයේ දී (තාවකාලික) |
|---|---|---|
| **බැංකු අංශය** | | |
| දළ අදියර 3 ණය අනුපාතය | 12.0 | 9.0 |
| වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය | 2.6 | 2.4 |
| හිමිකම් මත ප්‍රතිලාභ අනුපාතය | 18.5 | 16.9 |
| ශුද්ධ පොලී ආන්තිකය | 4.5 | 4.4 |
| ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය | 19.4 | 17.3 |
| **මුදල් සමාගම් අංශය** | | |
| දළ අදියර 3 ණය අනුපාතය | 8.3 | 5.1 |
| වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය | 6.9 | 5.7 |
| හිමිකම් මත ප්‍රතිලාභ අනුපාතය | 15.2 | 15.6 |
| ශුද්ධ පොලී ආන්තිකය | 11.5 | 10.4 |
| ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය | 22.0 | 19.3 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

කොටස් වෙළඳපොළ සලකා බැලීමේ දී, 2026 වසරේ පළමු මාස හය තුළ දී කොළඹ කොටස් හුවමාරුවේ සියලු කොටස් මිල දර්ශකය (ASPI) 1.6%ක පහත වැටීමක් වාර්තා කළ අතර, එස් ඇන්ඩ් පී ශ්‍රී ලංකා 20 (S&P SL20) දර්ශකය 0.8%ක සුළු ඉහළ යෑමක් වාර්තා කළේය. 2025 වසරේ දී සියලු කොටස් මිල දර්ශකය සහ එස් ඇන්ඩ් පී ශ්‍රී ලංකා 20 දර්ශකය, පිළිවෙළින්, 41.9%ක් සහ 26.6%ක් ලෙස වාර්තා කළ ඉහළ වාර්ෂික වර්ධනයට සාපේක්ෂව, මෙය කොටස් වෙළඳපොළ කාර්යසාධනයේ කැපී පෙනෙන මන්දගාමී වීමක් සනිටුහන් කළේය.

කොටස් වෙළඳපොළ ආශ්‍රිත මෙම දුර්වල කාර්යසාධනය සඳහා මැදපෙරදිග කලාපයේ භූ දේශපාලනික ආතතීන් හේතුවෙන් උද්ගත වූ ඉහළ ගෝලීය අවිනිශ්චිතතාවයන් හේතු විය. එය දේශීය බලශක්ති මිල ගණන් ඉහළ යෑමටත් උද්ධමනකාරී පීඩන වැඩි වීමටත් හේතු වූ අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් මුදල් ප්‍රතිපත්ති දැඩි කිරීමට සිදු විය. මෙම තත්ත්වයන් ආයෝජක විශ්වාසය සහ වෙළඳපොළ සහභාගීත්වය කෙරෙහි බලපෑම් ඇති කළ අතර, 2025 වසරේ වාර්තා වූ රුපියල් මිලියන 5,179.2ක් වූ වාර්ෂික දෛනික සාමාන්‍ය පිරිවැටුමට සාපේක්ෂ ව 2026 වසරේ පළමු මාස හය තුළ දෛනික සාමාන්‍ය පිරිවැටුම රුපියල් මිලියන 4,468.4ක් දක්වා පහත වැටුණි.

විදේශ ආයෝජන අඛණ්ඩව පිටතට ගලා යෑම මගින් ඉහළ ගිය ගෝලීය අවිනිශ්චිතතා සහ දැඩි ගෝලීය මූල්‍ය තත්ත්වයන් මධ්‍යයේ, ජාත්‍යන්තර ආයෝජකයින් අතර පවතින අවදානම් මගහරවා ගැනීමට කටයුතු කිරීමේ ප්‍රවණතාව පිළිබිඹු කරන ලදී.

### 3.7. ගෝලීය ප්‍රවණතා

***මැදපෙරදිග අර්බුදමය තත්ත්වය හේතුවෙන් ගෝලීය ආර්ථික වර්ධනය මන්දගාමී වනු ඇතැයි පුරෝකථනය කරන අතර, ගෝලීය වශයෙන් මතුපිට උද්ධමනය වසර තුළ දී ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ. බොහෝ මහ බැංකු දැඩි මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයක් කෙරෙහි යොමු වීම හමුවේ ගෝලීය මුදල් ප්‍රතිපත්තිය වඩාත් ප්‍රවේශම්කාරී ස්ථාවරයක් වෙත නැඹුරු වෙමින් පවතී.***

2026 වසරේ ජූලි මාසයේ මැද කාලයේදී, මැදපෙරදිග අර්බුදකාරී තත්ත්වය තීව්‍ර වීමට පෙර නිකුත් කරන ලද 2026 වසරේ ජූලි මාසයට අදාළ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ලෝක ආර්ථික ඉදිරි දැක්ම අනුව, 2026 වසරේ දී ගෝලීය ආර්ථික වර්ධනය 3.0%ක් දක්වා මන්දගාමී වී, ඉන් අනතුරුව 2027 වසරේ දී 3.4%ක් දක්වා ඉහළ යනු ඇතැයි පුරෝකථනය කර ඇත. මෙම ආර්ථික වර්ධනය, 2024/2025 වසරවල දී නිරීක්ෂණය කරන ලද 3.5% සාමාන්‍යය වර්ධනයට සාපේක්ෂව පහළ අගයක් වුව ද, මෙම පුරෝකථන 2026 වසරේ අප්‍රේල් මාසයේ පුරෝකථනයෙන් බොහෝ දුරට නොවෙනස්ව පවතී. මැදපෙරදිග අර්බුදකාරී තත්ත්වයේ බලපෑම් හේතුවෙන් ගෝලීය ආර්ථික වර්ධනයේ මන්දගාමී වීමක් පිළිබිඹු කළද, කෘත්‍රිම බුද්ධිය දියුණු වීම සහ එම තාක්ෂණය භාවිතයට ගැනීම හේතුවෙන් ගෝලීය තාක්ෂණික අංශයේ ඉල්ලුම මත පදනම් වූ වර්ධනය මගින් මෙම අර්බුදකාරී තත්ත්වයේ බලපෑම් කිසියම් දුරකට අඩු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. බලශක්ති මිල ගණන් ඉහළ යෑම හේතුවෙන් උද්ධමනය සහ උද්ධමන අපේක්ෂාවන් ඉහළ ගොස් ඇත.

**රූප සටහන 32: භූ දේශපාලනික අවදානම් දර්ශකය**




මූලය: *https://www.matteoiacoviello.com/gpr.htm*

මහ බැංකු ක්‍රියාමාර්ග, පොලී අනුපාතික සහ ප්‍රතිපත්තිමය බලපෑම් සම්බන්ධයෙන් මහජනතාව, මාධ්‍ය සහ වෙළඳපොළ තුළ පවතින අවිනිශ්චිතතා පෙන්නුම් කරන මුදල් ප්‍රතිපත්ති අවිනිශ්චිතතා දර්ශක (MPUI) ඉතිහාසයේ වාර්තා කර ඇති ඉහළම මට්ටමට ළඟා වී ඇති අතර, එමගින් මුදල් ප්‍රතිපත්තිවලවල අනාගත ගමන්මග, ඒවා ආර්ථිකය කෙරෙහි බලපෑමට ගතවන කාලය සහ ඒවායේ ඵලදායීත්වය කෙරෙහි පවතින

අවිනිශ්චිතතාවයන් පෙන්නුම් කරයි. ඒ අනුව, දැනට දක්නට ඇති උද්ධමනකාරී පීඩන, සහ ආර්ථික ක්‍රියාකාරකම් සාපේක්ෂ වශයෙන් මන්දගාමී වීම හේතුවෙන් ගෝලීය මුදල් ප්‍රතිපත්තිය ලිහිල් කිරීම සඳහා වන ඉඩකඩ අඩු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මේ අතර, ප්‍රතිපත්ති අවිනිශ්චිතතාව මෙන්ම භූ දේශපාලනික අවිනිශ්චිතතාව ද 2027 වසර පුරා ඉහළ මට්ටමක පවතිනු ඇතැයි උපකල්පනය කෙරේ.

එක්සත් ජනපද ෆෙඩරල් සංචිත බැංකුව 2025 වසරේ සැප්තැම්බර්, ඔක්තෝබර් සහ දෙසැම්බර් මාසවල දී පොලී අනුපාතික අඩු කිරීමෙන් පසුව, 2026 වසරේ මේ දක්වා කාලය තුළ පොලී අනුපාතික 3.50–3.75% මට්ටමේ පවත්වාගෙන ගොස් ඇත. ගෝලීය බලශක්ති මිල ගණන් මෑත කාලීනව ඉහළ යෑමේ ප්‍රතිඵලයක් වශයෙන් උද්ධමනය ඉහළ ගිය ද ආර්ථික ක්‍රියාකාරකම්වල දක්නට ලැබුණු ශක්තිමත් වර්ධනය හේතුවෙන් 2026 ජුනි මාසයේදී පැවති මුදල් ප්‍රතිපත්ති විවරණයේ දී පොලී අනුපාතික තවදුරටත් නොවෙනස්ව තබා ගැනීමට ෆෙඩරල් සංචිත බැංකුව තීරණය කළේය. අඛණ්ඩව තුන් වරක් සිය ප්‍රධාන ප්‍රතිපත්ති පොලී අනුපාතික නොවෙනස්ව තබා ගැනීමට තීරණය කළ යුරෝපීය මහ බැංකුව, 2026 වසරේ ජුනි මුදල් ප්‍රතිපත්ති විවරණයේ දී සිය ප්‍රධාන පොලී අනුපාතික ත්‍රිත්වය පදනම් අංක 25කින් ඉහළ දැමුවේය. ඒ අනුව, මැදපෙරදිග යුදමය තත්ත්වය මුල්කරගෙන උද්ගත වන උද්ධමනකාරී පීඩන හේතුවෙන් යුරෝපීය මහ බැංකුව තැන්පතු පහසුකම් අනුපාතිකය 2.25%ක් දක්වා ඉහළ දැමීමට පියවර ගත් අතර, උද්ධමනය ඉහළ යෑමේ සහ ආර්ථික වර්ධනය පහළ යෑමේ අවදානම් හේතුවෙන් ඉදිරි දැක්ම තවදුරටත් අවිනිශ්චිතව පවතින බව ද පෙන්වා දී ඇත. මෙම අවදානම්වල මැදි කාලීන බලපෑම, බලශක්ති මිල ගණන් ආශ්‍රිත කම්පනවල තීව්‍රතාව සහ කම්පන පවත්නා කාලසීමාව මෙන්ම ඒවායේ වක්‍ර සහ ද්විතීයික බලපෑම්වල ප්‍රබලත්වය මත රඳා පවතිනු ඇති බව ද යුරෝපීය මහ බැංකුව වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත. 2025 වසරේ දෙසැම්බර් මාසයේ දී බැංකු අනුපාතිකය පහළ දැමීමෙන් පසුව, එංගලන්ත මහ බැංකුව 2026 වසරේ ජුනි මස මුදල් ප්‍රතිපත්ති විවරණයේ දී බැංකු අනුපාතිකය 3.75% මට්ටමේ පවත්වාගෙන යන ලදී. මැදපෙරදිග යුද්ධය හේතුවෙන් ගෝලීය බලශක්ති මිල ගණන් සම්බන්ධයෙන් පවතින අවිනිශ්චිතතාව ඉහළ ගොස් ඇති බවත් විශේෂයෙන්ම, ඉහළ ගිය බලශක්ති මිල ගණන් අඛණ්ඩව පැවතුණහොත් මිල ගණන් සහ වැටුප් කෙරෙහි දෙවන වටයේ බලපෑම් ඇති වීමේ අවදානම තීව්‍ර වියහැකි බවත් එංගලන්ත මහ බැංකුව පෙන්වා දෙයි. එමෙන්ම, කුටුම්බ සහ ව්‍යාපාර සඳහා වන පොලී අනුපාතික තවදුරටත් යුදමය තත්ත්වයට පෙර පැවති මට්ටම්වලට වඩා ඉහළින් පැවතීම හේතුවෙන් කාලයත් සමඟ මෙමගින් උද්ධමනය පහළ යෑමේ පීඩනයක් ඇති කරනු ඇතැයි අපේක්ෂා කරන බවත් එංගලන්ත මහ බැංකුව තවදුරටත් පෙන්වා දෙයි.2025 වසරේ දෙසැම්බර් මාසයේ දී කෙටි කාලීන ප්‍රතිපත්ති පොලී අනුපාතිකය 0.75% දක්වා පදනම් අංක 25කින් ඉහළ දැමීමෙන් පසුව, ජපාන මහ බැංකුව 2026 වසරේ ජුනි මස මුදල් ප්‍රතිපත්ති විවරණයේ දී එම අනුපාතිකය පදනම් අංක 25කින් 1.00%ක් දක්වා තවදුරටත් ඉහළ දැමූ අතර, එය වසර 31ක කාලය තුළ දී වාර්තා වූ ඉහළම මට්ටම විය. පොලී අනුපාතික ඉහළ නැංවීමත් සමඟ, මැදපෙරදිග යුදමය තත්ත්වයෙන් ඇති වූ බලශක්ති කම්පන හේතුවෙන් ඇතිවන මිල පීඩනය අවම කිරීම කෙරෙහි අවධානය යොමු කරමින්, මුදල් ප්‍රතිපත්ති තවදුරටත් දැඩි කිරීමට සූදානම් බව ජපාන මහ බැංකු සංඥා කර ඇත. මේ අතර, භූ දේශපාලනික අර්බුද තීව්‍ර වීම හේතුවෙන් නැඟී එන වෙළඳපොළ ආර්ථිකයන් තවදුරටත් මුදල් ප්‍රතිපත්ති ලිහිල් කරනු ඇතැයි යන අපේක්ෂාව පහළ ගොස් ඇත. පිලිපීන මහ බැංකුව, සර්බියානු ජාතික බැංකුව සහ දකුණු අප්‍රිකානු සංචිත බැංකුව ඇතුළු නැඟී එන වෙළඳපොළ ආර්ථිකයන්හි මහ බැංකු ඔවුන්ගේ මෑත කාලීන මුදල් ප්‍රතිපත්ති විවරණවල දී ප්‍රතිපත්ති පොලී අනුපාතික ඉහළ දැමූ අතර, මැදපෙරදිග යුද්ධයෙන් හටගත් ඉහළ අවිනිශ්චිතතාවයන් සහ එය දේශීය මිල ගණන් කෙරෙහි එල්ල කළ උද්ධමනකාරී බලපෑම් එයට හේතු වශයෙන් දක්වා ඇත.

**රූප සටහන 33: ගෝලීය ප්‍රතිපත්ති පොලී අනුපාතික වෙනස්වීම්**




සටහන: 2026 ජුලි මස 21 වන දිනට පවතින දත්ත මත පදනම් වේ.

මූලය: https://www.cbrates.com

2025 වසරේ දී සහ 2026 වසර මුල් කාලයේ දී වාර්තා වූ මට්ටම්වලට සාපේක්ෂව වර්තමානයේ දී ගෝලීය ආහාර සහ බලශක්ති මිල ගණන්වල උච්චාවචනය ඉහළ ගොස් ඇත. වර්තමාන ගෝලීය තෙල් මිල ගණන්වල මෙම උච්චාවචනය සඳහා මැදපෙරදිග අර්බුදමය තත්ත්වය හේතුවෙන් උද්ගත වන සැපයුම් අංශයේ ගැටලුකාරී තත්ත්වයන් හේතු වී ඇත. ආහාර සහ කෘෂිකර්ම සංවිධානයේ ආහාර මිල ගණන් දර්ශකය 2025 වසරේ දෙසැම්බර් මාසයේ දී වාර්තා කළ 124.5ක දර්ශක අගයේ සිට 2026 වසරේ අප්‍රේල් මාසයේ දී 131.0ක දර්ශක අගයක් කරා ළඟා වීමෙන් පසු, 2026 වසරේ ජූනි මාසයේ දී 130.3ක සාමාන්‍යයක් වාර්තා කළේය. 2025 වසරේ දෙසැම්බර් මාසයට සාපේක්ෂව, 2026 වසරේ ජූනි මාසයේ දී ආහාරයට ගන්නා තෙල්, මාංශ සහ ධාන්‍ය වර්ගවල මිල දර්ශකයන් ඉහළ ගිය අතර, කිරි නිෂ්පාදන සහ සීනි මිල දර්ශකයන් පහළ ගියේය.

*රූප සටහන* **34: ගෝලීය බලශක්ති මිල ගණන් සහ ආහාර මිල ගණන් වල හැසිරීම**




මූලය: fred.stlouisfed.org




මූලය: ආහාර හා කෘෂිකර්ම සංවිධානය

ISBN 978-624-6764-39-5